# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த முன்னேற்ற அறிக்கை
# Annual Performance Report

# 2012

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு
Ministry of Culture & the Arts

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 ට අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2012

**ප්‍රකාශනය**

**සැලසුම් අංශය**

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**8 වන මහල**

**සෙත්සිරිපාය, බත්තරමුල්ල**

### ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

### පොදු හදවත් ස්පර්ශ කරන සංස්කෘතික දායාද පාරම්පරික උරුමයකි



ශ්‍රී ලංකා මාතෘ භූමියේ සංස්කෘතික හා කලා කටයුතු නගා සිටුවීමේ ජාතික මෙහෙවරෙහි නිරතව ප්‍රගති සමාලෝචන වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සොම්නස් සිත් පෙරදැරිවය. දේශීය සංස්කෘතිය හා කලාව ජන්මයෙන් ම අප හදවත් ස්පර්ශ කරන්නේ දෙමාපිය පාරම්පරික උරුමයක් වශයෙනි. මේ නිසාම සංස්කෘතිය හා කලාව පිළිබඳව ශ්‍රී ලාංකීය පොදුජන හදවත්වල ගැඹුරට කිඳා බැසගත් ආකල්ප දේශ හා ජාති හිතෛශී වන්නේ ය. එබඳු ජන සමාජයක සංස්කෘතික හා කලා කටයුතු උදෙසා කිසියම් මෙහෙවරක් ඉටු කරනට ලැබීම භාග්‍යයකි, වාසනාවකි.

ජාතික වශයෙන් වැදගත් වන කාර්යභාරයක් ඉටු කිරීමට අමාත්‍යාංශගතව සිදුවන්නේ සාමූහික කළමනාකරණ ක්‍රියාවලියකි. ඒ සඳහා පරිපාලන ධූරාවලියේ කවර තැන්හි කවර නිලයක නිරත වන්නකුගේ වුව ද සේවා රාජකාරිය ඉතා වැදගත් ය. මෙය නිවැරදිව තේරුම් ගනිමින් ක්‍රියා කරන්නේ නම් උද්ගත වන ගැටලු විසඳාගනිමින් යහපාලනයක් යටතේ සාර්ථක කාර්ය භාරයක නිරත විය හැකි ය. ඒ සඳහා සියලු දෙනාගේ ම ඇප කැපවීම උපන් මව්බිමට ළෙන්ගතුකමින් සිදුවන්නේ නම් ඇතිවන්නේ ඉතා ඵලදායී සංවර්ධනයකි.

සංස්කෘතික ප්‍රබෝධයක් දීප ව්‍යාප්තව පවතින මහින්ද චින්තන වැඩ පිළිබඳව තව දුරටත් අර්ථවත් කිරීමටත්, ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමටත් ඔබ - අප දරන සාමූහික ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි.

**ටී. බී. ඒකනායක**

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය**

**පෙරවදන**



සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ 2012 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ප්‍රගති සටහන් සහිතව ධනාත්මකව ඉදිරිපත් කරන්නට ලැබීම ජාතික වශයෙන් අප තබන ජයග්‍රාහී ඉදිරි පියවරකි. පුද්ගල උපතේ පටන් සමාජගත ජීවිතයේ බොහෝ අවස්ථාවල දී සංස්කෘතිය හා කලාව සමග බද්ධව ක්‍රියා කිරීමට සිදුවේ. එහෙත් සංස්කෘතික දායාද හා උරුමයන් ස්පර්ශ කළ නොහැකි, භෞතික වස්තූන්, දේපළ ඉක්මවා ගිය සම්පත් ය. ඒවා මැනවින් කළමනාකරණය කරමින් රටක දැයේ ඉදිරි පැවැත්මටත්, අභිමානයටත් සරිලන අයුරින් ක්‍රියා කිරීම අප සතු කාර්යසාධනය අර්ථ ගන්වයි.

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පාලන හා මූල්‍ය, ප්‍රවර්ධන, ඉදිකිරීම්, විදේශ, මාධ්‍ය, සැලසුම්, ප්‍රසම්පාදන, අභ්‍යන්තර විගණන යන අංශයන්ගේ දායකත්වයෙන් ක්‍රියාවට නංවන අමාත්‍යාංශ වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මෙන් ම අන්තර්ජාතික වශයෙන් ද ක්‍රියාත්මක වේ. දේශීය සංස්කෘතියට පුනර්ජීවයක් ලබාදෙන අයුරින් සම්පාදනය වන සියලු වැඩසටහන් නූතන විද්‍යාත්මක හා තාක්ෂණික සංකල්පවලට ද අනුගත ව සම්පාදනය වේ.

අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ටවර් හෝල් රඟහල පදනම හා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් වෙන වෙනම වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් කරනු ලබයි. එහෙත් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමක් සිදු නොකරන බැවින් එහි 2012 වාර්ෂික කාර්ය සාධනය ද මේ සමග ඉදිරිපත් කර ඇත.

අප අමාත්‍යාංශයේ ඉදිරි කටයුතු දේශයේ උන්නතිය උදෙසා සවිමත් පිටුබලයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**වසන්ත ඒකනායක**
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2012

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ අදාළ අංශ මඟින් 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද කාර්යභාරය මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අඩංගු වන අතර අදාළ අංශවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය, සේවක සංඛ්‍යාව, වාර්ෂික පුහුණු වැඩසටහන් ආදි විස්තර ඇතුළත් කොට ඇත. තවද මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය හැර අනිකුත් ආයතන වෙන වෙනම කාර්යසාධන වාර්තා ඉදිරිපත් කරන බැවින් මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාවට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 2012 වසර පුරා සිදු කරනු ලැබූ කාර්යභාරය පමණක් ඇතුලත් කොට ඇති බැව් සැලකුව මැනවි.**

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2012

පටුන | පිටු අංක


**1. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය** **08**
- 1.1 දැක්ම, මෙහෙවර, අරමුණු
- 1.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය – සංවිධාන සැලැස්ම

**2. පාලන කටයුතු** **10**
- 2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය - 2012
- 2.2 2012.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව
  - 2.2.1 ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.2 ද්විතීක මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.3 තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.4 ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය
- 2.3 අමාත්‍යාංශයේ නිලධාරින් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම
- 2.4 2012 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව
  - 2.4.1 ස්ථාන මාරුවීම්
  - 2.4.2 විශ්‍රාම ලබා ගැනීම්

**2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය** **14**
- 2.a.I කාර්යභාරය

**3. මූල්‍යය කටයුතු** **15**
- 3.1 සංස්කෘතික අමාත්‍යාංශ වැඩ සටහන් පිළිබඳ වියදම්
  - 3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්
  - 3.1.2 පුනරාවර්තන වියදම් විස්තර
  - 3.1.3 ප්‍රාග්ධන වියදම් විස්තර
- 3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර

**4. සංස්කෘතික ප්‍රවර්ධනය** **19**
- 4.1 සංස්කෘතික ප්‍රවර්ධන අංශයේ කාර්ය භාරය
- 4.2 සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු
- 4.3 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන
  - 4.3.1 සංස්කෘතික මධ්‍යස්ථානවලින් නොමිලේ පුහුණුව ලබාදෙන සෞන්දර්ය හා අනිකුත් කුසලතා සංවර්ධන වැඩසටහන්
  - 4.3.2 සංස්කෘතික මධ්‍යස්ථාන විසින් තම ප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන්
  - 4.3.3 ජාතික වැඩසටහන්/විශේෂ වැඩසටහන් සඳහා ලබාදිය හැකි නර්තන අංග සහ ශිල්පීන්
- 4.4 අංගම් සටන් ශිල්ප කලාව ව්‍යාප්ත කිරීම
- 4.5 ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
- 4.6 ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය
  - 4.6.1 ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය - දෘෂ්‍ය පටිගත කිරීම්වල ප්‍රගතිය (2012)
- 4.7 2012 වසර තුළ පවත්වන ලද වෙනත් වැඩසටහන්
- 4.8 රසවින්දන වැඩසටහන් පැවැත්වීම
- 4.9 සංස්කෘතික ප්‍රවර්ධන අංශය මගින් පවත්වන ලද වාර්ෂික පුහුණු වැඩසටහන්
- 4.10 මූල්‍ය ප්‍රගතිය - 2012
- 4.11 අමාත්‍යාංශ වෙබ් අඩවිය නවීකරණය කිරීම
- 4.12 යුනෙස්කෝ වැඩමුළුව
- 4.13 ආයතන කටයුතු

**5. සංස්කෘතික යටිතල පහසුකම් සංවර්ධනය** **30**
5.1 කාර්යභාරය
5.2 මූල්‍ය ප්‍රගතිය
5.3 නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම - 2012
5.4 දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කෙරෙන අනිකුත් ව්‍යාපෘති
5.4.1 සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම - හික්කඩුව
5.4.2 සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය - මාතර, නාවිමන, මොරකැටියහේන
5.4.3 වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම

**6. විදේශ සංස්කෘතික සබඳතා** **35**
6.1 කාර්යභාරය
6.2 විදේශ සංචාර 2012
6.3 විදේශීය සංචාරක/වෙනත් විශේෂ කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණීම - 2012
6.4 සංස්කෘතික අවබෝධතා ගිවිසුම් වලට එළඹීම - 2012

**7. සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු** **39**
7.1 ප්‍රසම්පාදන අංශය මගින් ඉටුකරනු ලබන කාර්ය භාරය
7.2 කාර්යයභාරය 2012
7.2.1 සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ/සේවා ලබාදීම
7.2.2 අමාත්‍යාංශය සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

**8. අභ්‍යන්තර විගණන කටයුතු** **40**
8.1 පිහිටුවීමේ පරමාර්ථ
8.2 කාර්යභාරය
8.3 2012 ඉටු කරන ලද කාර්යභාරය

**9. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය** **42**
9.1 ප්‍රතිපාදන සහ මූල්‍ය ප්‍රගතිය - 2012
9.2 කාර්ය මණ්ඩලය - 2012
9.3 ප්‍රගතිය - 2012
9.3.1 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ පරීක්ෂාවට ලක් වූ නිර්මාණ
9.3.2 2010 - 2012 දක්වා උපයා ඇති රාජ්‍ය ආදායම්
9.3.3 නිරන්තර සේවා

# 1. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

## 1.1 දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

අනාගතය උදෙසා ජාතියේ අභිමානය සහ අද්විතීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට කැප වූ සාඩම්බර ශ්‍රී ලංකාවක්.

### මෙහෙවර

ස්වකීය සමස්ත සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කරනු ලබන රටක් වශයෙන් ලොව සෙසු රටවල් සමග ඉදිරියට ගමන් කිරීම පිණිස ශ්‍රී ලාංකීය සංස්කෘතියේ සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

### අරමුණු

රටක සංස්කෘතිය, එම රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන සියළු වැඩසටහන් වඩාත් ඵලදායී ලෙස සඵල කර ගැනිම සඳහා ඉවහල් වන, ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීමට හේතුවන ආකාරයෙන් ජනතාව ස්වයං ව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම.

- ශ්‍රී ලාංකික බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම.


- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මගින් රටේ ජනතාවගේ ජීවිතයේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස් කර ගැනීමට මං සැලසීම.

- සාධනීය සංස්කෘතිකාංග හඳුනාගැනීමට හා ඒවා තම ජීවිතයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම හා ඒ මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව ඇති සංස්කෘතියක් ගොඩ නැගීම.

- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර හා අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒවා නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබාදීම.

- දේශාභිමානී චින්තනය පෙරටුකරගත් සංවර්ධන ඉලක්ක සපුරාලීමට සමත්, ස්වයං අභිප්‍රේරණික වුත්, සාමූහිකවූත්, බලවේගයක් ලෙස සමාජය තුළ මුල් බැස ගැනීමට සැලැස්වීම.

# 1.2 සංස්කෘතික හා කලාකටයුතු අමාත්‍යාංශය – සංවිධාන සැලැස්ම



# 2. පාලන කටයුතු

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සියළුම පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කරලීම හා එහි අධීක්ෂණ ක්‍රියාවලිය පාලන අංශය මඟින් සිදු කෙරේ.

## 2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය- 2012

| | | තනතුර | නම |
|---|---|---|---|
| 1. | | අමාත්‍යාංශ ලේකම් | විමල් රුබසිංහ මහතා<br>වසන්ත ඒකනායක මහතා - 2012 ජුලි 16 සිට |
| 2. | I | අතිරේක ලේකම්<br>(සංස්කෘතික ප්‍රවර්ධන) | එච්.ඩී.එස්.මල්කාන්ති මහත්මිය |
| | II | අතිරේක ලේකම්(පාලන හා මුදල්/විදේශ/ඉදිකිරීම්) | එන්.පී.වී.සී. පියතිලක මහතා |
| 3. | | ප්‍රධාන ගණකාධිකාරී | සී.වීරසිංහ මහතා |
| 4. | | අධ්‍යක්ෂ(සැලසුම්) | කේ.ඩබ්ලිව්.එස්.පී.අතුකෝරල මහත්මිය |
| 5. | I | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>(සංස්කෘතික ප්‍රවර්ධන) | ඩබ්.සුනීතා කුරේ මහත්මිය |
| | II | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>(පාලන/මධ්‍යස්ථාන පාලන/විදේශ/ඉදිකිරීම්) | ඒ.ඩී.ආර්.එස්. අතපත්තු මහත්මිය |
| 6. | I | ප්‍රධාන අභ්‍යන්තර විගණක | කේ.කේ.ජී.සිසිර කුමාර මහතා |
| | II | ගණකාධිකාරී ගෙවීම් | එස්.ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය |
| | III | ගණකාධිකාරී(ප්‍රසම්පාදන) | ඩී.ඩී.සී.සෙනෙවිරත්න මහත්මිය |
| 7. | I | සහකාර ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන/ඉදිකිරීම්) | වජිර රත්නායක මහතා |
| | II | සහකාර ලේකම් (පාලන/මධ්‍යස්ථාන පාලන) | බී.ඒ.අයි.පියුමි මහත්මිය |
| | III | සහකාර ලේකම්(විදේශ/ප්‍රවාහන/ඉදිකිරීම්) | ඩී. ලියනගම මහත්මිය |
| 8. | | වැ. බ. පරිපාලන නිලධාරී | ආර්.ඒ.ඩබ්ලිව්. පෙරේරා මහතා |

## 2.2. 2012.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව

### 2.2.1. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | විශේෂ | SL.4 | 1 | **01** | - | - | **01** | - | - | |
| අතිරේක ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | විශේෂ | SL.3 | 1 | **02** | - | - | **02** | - | - | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | I | SL.1 | 1 | **02** | - | - | **02** | - | - | |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | **01** | - | - | **01** | - | - | |
| අධ්‍යක්ෂ | ශ්‍රී. ල. සැ. සේ. | විශේෂ | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| සහකාර ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | III | SL.1 | 1 | 02 | - | - | 02 | - | - | |
| නියෝජ්‍යඅධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ල. ප. සේ. | II/III | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| ගණකාධිකාරි | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | 02 | - | - | 02 | - | - | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| ඉංජිනේරු | ශ්‍රී. ල. ඉ. සේ. | II/III | SL.1 | 1 | 01 | - | - | - | - | - | පුරප්පාඩු |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | **14** | | | **13** | | | |

### 2.2.2. ද්විතීක මට්ටමේ නිලධාරි මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරිපාලන නිලධාරි | රා. කා. ස. සේ | අධි ශ්‍රේණිය | MN.7 | 02 | 01 | - | - | වැ.බ. 01 | - | - | පුරප්පාඩු 01 |
| ලේකම්තුමාගේ පෞද්ගලික ලේකම් | තාවකාලික | - | - | 02 | 01 | - | - | 01 | - | - | |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | - | MN.6 | 02 | 02 | - | - | 01 | - | - | පුරප්පාඩු 01 |
| **ද්විතීයික මට්ටම** | | | | | **04** | | | **02** | | | |

## 2.2.3. තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| අයවැය සහකාර | ආශ්‍රිත නිලධාරීන් | - | **MN.4** | **03** | **01** | - | - | **01** | - | - | |
| සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | එම | | **MN.4** | 03 | 201 | - | - | 191 | - | - | පුරප්පාඩු 10 |
| සංවර්ධන සහකාර | එම | - | **MN.4** | **03** | 04 | - | - | 04 | - | - | |
| නීති සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| ප්‍රලේඛන සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| විමර්ෂණ සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| ගිණුම් සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| තොරතුරු තාක්ෂණ සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | - | - | - | පුරප්පාඩු 01 |
| මාධ්‍ය සහකාර | එම | | **MN.4** | **03** | 02 | - | - | - | - | - | පුරප්පාඩු 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. කා. ස. සේ. | **I/II/III** | **MN.2** | **03** | 55 | - | - | 50 | - | - | පුරප්පාඩු 05 |
| සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | දෙපාර්තමේන්තුගත | | **MN.**1 | 03 | 180 | - | - | 160 | - | - | පුරප්පාඩු 20 |
| වීඩියෝ කැමරා ක්‍රියාකරවන්නා | තාවකාලික | | - | 03 | 01 | - | - | 01 | - | - | ම.සංස්.අ. සම්බන්ධ කර ඇත. |
| කැමරාකරු | එම | | - | 03 | 01 | - | - | 01 | - | - | ම.සංස්.අ. සම්බන්ධ කර ඇත |
| **තෘතීයික මට්ටම** | | | | **450** | | | | **410** | | | |

## 2.2.4. ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රියදුරු | ඒකාබද්ධ සේවය | | | 4 | 19 | - | - | 19 | - | - | |
| කා.කා.ස. | එම | | | 4 | 20 | - | - | 16 | - | - | පුරප්පාඩු 04 |
| පිළිගැනීමේ නිළධාරී | දෙපාර්තමේන්තුගත | | | 4 | 01 | - | - | 01 | - | - | - |
| සංස්කෘතික මධ්‍යස්ථාන කා.කා.ස. | දෙපාර්තමේන්තුගත | | | 4 | 180 | - | - | 149 | - | - | පුරප්පාඩු 31 |
| සංස්කෘතික මධ්‍යස්ථාන මුරකරු | දෙපාර්තමේන්තුගත | | | 4 | 180 | - | - | 148 | - | - | පුරප්පාඩු 32 |
| වීඩියෝකරණ සහකාර | තාවකාලික | | | 4 | 01 | - | - | - | - | - | පුරප්පාඩු 01 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | **869** | | | **758** | | | |

## 2.3 අමාත්‍යාංශයේ නිලධාරින් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම

### 2012 වසර තුළ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම

| | පුහුණු වැඩසටහන | සහභාගිත්වය |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඉංග්‍රිසි / දෙමළ | **28** |
| 02 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පාඨමාලාව | **03** |
| 03 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාඨමාලාව | 06 |
| 04 | රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පාඨමාලාව | **07** |
| 05 | අමාත්‍යාංශ නිලධාරින්ගේ ( පාලන අංශයේ මූලිකත්වයෙන්) | 86 |

## 2.4 2012 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව පහත දක්වා ඇත.

### 2.4.1. ස්ථාන මාරුවීම්

| | නම | සේවය |
|---|---|---|
| 01 | ජී.ගමගේ මහත්මිය | ශ්‍රී.ල.ප.සේ.i |
| 02 | එම්.එන්.රාජපක්ෂ මහත්මිය | ශ්‍රී.ල.ප.සේ.ii |
| 03 | එල්.බී.එස්.කුමුදුනී මහත්මිය | රා. කළ. ස ii |
| 04 | ආර්.පී.රංජනී මහත්මිය | රා. කළ. ස. i |
| 05 | ජේ.ජී.සිරියලතා මහත්මිය | රා. කළ. ස. i |
| 06 | කීර්ති පනාගොඩ මහතා | කා.කා.ස. |
| 07 | තිස්ස කුමාරනායක මහතා | කා.කා.ස. |
| 08 | බිමල් රෝහිත මහතා | කා.කා.ස. |

### 2.4.2. විශ්‍රාම ලබාගැනීම

| | නම | සේවය |
|---|---|---|
| 01 | එම්.පී.ඩී.චන්ද්‍රසිරි මහතා | රියදුරු |
| 02 | කේ.ඩී.එස්.කුඩාරත්න මහතා | රියදුරු |
| 03 | ඩී.ඩී.දරිපු මහතා | කා.කා.ස. |

# 2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සියළුම සංස්කෘතික මධ්‍යස්ථාන වල පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරලීම හා අධීක්ෂණ ක්‍රියාවලිය මධ්‍යස්ථාන පාලන අංශය මගින් සිදු කෙරේ.

**සංස්කෘතික මධ්‍යස්ථානයක කාර්ය මණ්ඩලය**

I. සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී
II. සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී
III. මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායක
IV. මධ්‍යස්ථාන මුරකරු
V. අනියම් කාර්යාල කාර්ය සහායක(කාර්යාල කාර්ය සහායක නොමැති සං.මධ්‍යස්ථාන සඳහා)
VI. අනියම් මුරකරු(මධ්‍යස්ථාන මුරකරුවකු නොමැති සං.මධ්‍යස්ථාන සඳහා)
VII. ආදේශක මුරකරු(මධ්‍යස්ථාන මුරකරු නිවාඩු ලබාගත් දින සඳහා)

## 2.a.I කාර්යභාරය

1. ඉහත අංක I සිට IV දක්වා වූ තනතුරු වලට අදාල පෞද්ගලික ලිපි ගොනු යථාවත් කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාම
   a. අනියම් තනතුරු වන කා.කා.ස. හා මුරකරු සඳහා ලිපිගොනු පවත්වාගෙන යාම
   b. සං.මධ්‍යස්ථානයන් සඳහා අවශ්‍යතාවය අනුව ආදේශ මුරකරු පත් කිරීම සිදු කිරීම

2. සං.මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ සියළුම නිවාඩු වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යාම.
   a. රාජකාරී විදේශ නිවාඩු හා පෞද්ගලික විදේශ නිවාඩු අනුමත කරවා ගැනීමේ ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාම
   b. අසනීප නිවාඩු, ප්‍රසූත නිවාඩු, අඩවැටුප් නිවාඩු, වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම

3. මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ ණය ලිපිගොනු පවත්වාගෙන යාම
   a. ආපදා ණය
   b. දේපළ ණය
   c. උත්සව අත්තිකාරම් ණය
   d. විශේෂ අත්තිකාරම් ණය

4. සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරුකිරීම්
   සෑම වර්ෂයකම සියළුම කාර්යමණ්ඩල ස්ථාන මාරු කිරීම් මාරු මණ්ඩලය මගින් සිදු කෙරේ. විනය හේතුමත මාරුකිරීම්, සුහද මාරු කිරීම් හා නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලා මාරු කිරීම්ද සිදු කෙරෙන බැවින් වර්ෂය මුළුල්ලේම ස්ථාන මාරු කිරීම් සිදු කෙරේ.

5. අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම

6. කාර්ය මණ්ඩලයේ විනය පරීක්ෂණ සම්බන්ධව කටයුතු සිදු කිරීම

7. කාර්යමණ්ඩල සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ රාජකාරි සිදු කිරීම

8. කාර්යමණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම

9. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සමබන්ධ සියළුම රාජකාරි සිදු කිරීම

# 3. 2012 මූල්‍ය කටයුතු

## 3.1 සංස්කෘතික අමාත්‍යංශ වැඩසටහන් පිළිබඳ වියදම්

### 3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

| අංකය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම | | | |
| 1. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යංශ පරිපාලනය | 111,190,000.00 | 106,431,434.93 | 96 |
| 1. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 419,370,000.00 | 384,358,350.68 | 92 |
| | **උප එකතුව** | **530,560,000.00** | **490,789,785.61** | 92 |
| 2 | ප්‍රාග්ධන වියදම | | | |
| 2. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යංශ පරිපාලනය | 32,750,000.00 | 23,384,115.50 | 71 |
| 2. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 515,015,000.00 | 355,828,697.28 | 69 |
| | **උප එකතුව** | **547,765,000.00** | **379,212,812.78** | **69** |
| | **මුළු එකතුව** | **1,078,325,000.00** | **870,002,598.39** | **81** |

### 3.1.2. පුනරාවර්තන වියදම් විස්තර

- සේවක වැටුප් පිළිබඳ වියදම් හා වැටුප් සමග ගෙවනු ලබන ජීවන අංක දීමනාව

| වැය විෂය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| **සේවක වැටුප් පිළිබඳ වියදම** | | | | |
| 177-1-1-1001 | අමාත්‍ය කාර්යාලය | 5,100,000.00 | 5,100,000.00 | 100 |
| 177-1-2-1001 | අමාත්‍යාංශ පරිපාලනය | 29,000,000.00 | 28,186,296.15 | 97 |
| 177-2-3-1001 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 114,400,000.00 | 110,791,403.42 | 97 |
| | **උප එකතුව** | **148,500,000.00** | **144,077,699.57** | 97 |
| වැටුප් සමග ගෙවනු ලබන දීමනා | | | | |
| 197-1-1-1003 | අමාත්‍ය කාර්යාලය | 2,100,000.00 | 2,100,000.00 | 100 |
| 177-1-2-1003 | අමාත්‍යාංශ පරිපාලනය | 14,200,000.00 | 13,969,598.96 | 98 |
| 177-2-3-1003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 63,400,000.00 | 61,271,015.32 | 97 |
| | **උප එකතුව** | **79,700,000.00** | **77,340,614.28** | **97** |
| | **මුළු එකතුව** | **228,200,000.00** | **221,418,313.85** | **97** |

➢ වෙනත් පුනරාවර්තන වියදම්

| වැය විෂය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| ගමන් වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 1,500,000.00 | 1,462,326.00 | 97 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 1,500,000.00 | 1,401,518.53 | 93 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,500,000.00 | 3,497,800.00 | 100 |
| | **උප එකතුව** | **6,500,000.00** | **6,361,644.53** | 98 |
| සැපයීම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 6,066,000.00 | 5,534,881.86 | 91 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 4,900,000.00 | 4,898,219.50 | 100 |
| | සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු | 8,050,000.00 | 7,466,242.91 | 93 |
| | **උප එකතුව** | **19,016,000.00** | **17,899,344.27** | **94** |
| නඩත්තු වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 2,400,000.00 | 1,519,409.29 | 63 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 3,764,000.00 | 3,514,661.76 | 93 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 1,500,000.00 | 1,176,832.40 | 78 |
| | **උප එකතුව** | **7,664,000.00** | **6,210,903.45** | **81** |
| සේවා | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 3,950,000.00 | 3,798,572.79 | 96 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 33,510,000.00 | 31,745,950.09 | 95 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 7,200,000.00 | 7,167,027.79 | 100 |
| | **උප එකතුව** | **44,660,000.00** | **42,711,550.67** | **96** |
| රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | | | | |
| | අමාත්‍යාංශ පරිපාලනය | 1,000,000.00 | 1,000,000.00 | 100 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 800,000.00 | 800,000.00 | 100 |
| | **උප එකතුව** | **1,800,000.00** | **1,800,000.00** | **100** |
| | විදේශ සබඳතා | 10,000,000.00 | 9,974,009.00 | 100 |
| | ජාතික සාහිත්‍ය කලා උත්සවය | 4,500,000.00 | 4,500,000.00 | 100 |
| | සමාජ ඒකාබද්ධතා | 5,000,000.00 | 5,000,000.00 | 100 |
| | ප්‍රසිද්ධ රූගම්පාලක මණ්ඩලය | 3,800,000.00 | 3,609,710.70 | 95 |
| | ටවර් හෝල් රඟහල පදනම | 34,000,000.00 | 26,500,000.00 | 78 |
| | මධ්‍යම සංස්කෘතික අරමුදල | 27,000,000.00 | 15,000,000.00 | 56 |
| | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට දායක මුදල් | 22,570,000.00 | 15,000,000.00 | 66 |
| | රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම | 1,100,000.00 | 1,100,000.00 | 100 |
| | දඹාන ජන උරුම කේන්ද්‍රය නඩත්තු කිරීම | 1,300,000.00 | 971,035.36 | 75 |
| | සංස්කෘතික මධ්‍යස්ථාන නඩත්තු කිරීම | 100,000,000.00 | 99,879,773.78 | 100 |
| | ශ්‍රී ලංකා කලා මණ්ඩලය | 4,250,000.00 | 3,553,500.00 | 84 |
| මුළු එකතුව | | **288,910,000.00** | **256,517,971.76** | **89** |

### 3.1.3. ප්‍රාග්ධන වියදම් විස්තර

➢ ගෘහ භාණ්ඩ , කාර්යාලීය උපකරණ හා යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම

| වැය විෂය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ භාණ්ඩ මිළදී ගැනීම | | | | |
| 177-1-1-2102 | අමාත්‍ය කාර්යාලය | 1,000,000.00 | 706,098.60 | 71 |
| 177-1-2-2102 | අමාත්‍යාංශ පරිපාලනය | 1,000,000.00 | 927,495.17 | 93 |
| 177-2-3-2102 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 25,000,000.00 | 23,119,491.33 | 92 |
| | උප එකතුව | **27,000,000.00** | **24,753,085.10** | 92 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම | | | | |
| 177-1-1-2103 | අමාත්‍ය කාර්යාලය | 1,000,000.00 | 1,000,000.00 | 100 |
| 177-1-2-2103 | අමාත්‍යාංශ පරිපාලනය | 2,407,000.00 | 2,349,295.20 | 98 |
| 177-2-3-2103 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,000,000.00 | 1,499,330.00 | 75 |
| | උප එකතුව | **5,407,000.00** | **4,848,625.20** | **90** |
| | මුළු එකතුව | **32,407,000.00** | **29,601,710.30** | **91** |

➢ යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ හා වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-1-1-2002 | අමාත්‍ය කාර්යාලය | 500,000.00 | 500,000.00 | 100 |
| 177-1-2-2002 | අමාත්‍යාංශ පරිපාලනය | 300,000.00 | 276,743.20 | 92 |
| 177-2-3-2002 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,000,000.00 | 1,586,174.76 | 79 |
| | උප එකතුව | **2,800,000.00** | **2,362,917.96** | **84** |
| වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-1-1-2003 | අමාත්‍ය කාර්යාලය | 2,300,000.00 | 1,270,255.03 | 55 |
| 177-1-2-2003 | අමාත්‍යාංශ පරිපාලනය | 2,700,000.00 | **2,223,546.39** | 82 |
| 177-2-3-2003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,500,000.00 | 3,435,023.23 | 98 |
| | උප එකතුව | **8,500,000.00** | **6,928,824.65** | **82** |
| | මුළු එකතුව | **11,300,000.00** | **9,291,742.61** | **82** |

➢ අනුබද්ධ ආයතන, ව්‍යාපෘති හා පුහුණු වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2012.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **අනුබද්ධ ආයතන වෙනුවෙන් වැය වූ මුදල්** | | | | |
| 177-2-3-5-2502 | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 2,000,000.00 | 566,800.00 | 28 |
| 177-2-3-6-2502 | ටවර් හෝල් රඟහල පදනම | 27,000,000.00 | 10,500,000.00 | 39 |
| | **උප එකතුව** | **29,000,000.00** | **11,066,800.00** | **38** |
| ප්‍රධාන ව්‍යාපෘති වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-2-3-2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් (සංස්කෘතික මධ්‍යස්ථාන) | 125,000,000.00 | 113,979,093.94 | 91 |
| 177-2-3-7-2502 | පවත්නා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම | 1,000,000.00 | 204,911.00 | 20 |
| 177-2-3-8-2502 | වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය | 20,000,000.00 | 15,012,665.00 | 75 |
| 177-2-3-9-2502 | දේශීය සාම්ප්‍රදායික දැණුම හා සංස්කෘතික වටිනාකම් නිරාවරණය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය | 6,450,000.00 | 2,856,191.85 | 44 |
| 177-2-3-12-2502 | සංස්කෘතික මධ්‍යස්ථාන පහසුකම් වැඩිදියුණු කිරීම | 40,000,000.00 | 10,601,848.78 | 26 |
| 177-2-3-15-2502 | එල්ෆින්ස්ටන් රඟහල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 66,565,000.00 | 19,000,000.00 | 28 |
| 177-2-3-16-2502 | සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වන සේවස්ථ පුහුණු මධයස්ථානය වැඩි දියුකු කිරීම | 3,000,000.00 | 1,080,625.47 | 36 |
| 177-2-3-17-2502 | ආදිවාසී ගම්මාන සංරක්ෂණය | 10,000,000.00 | 5,551,399.42 | 55 |
| 177-2-3-18-2502 | සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 35,000,000.00 | 34,999,683.79 | 100 |
| 177-2-3-18-2502 | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම | 145,000,000.00 | 110,654,093.38 | 76 |
| | **උප එකතුව** | **452,015,000.00** | **313,940,512.63** | **69** |
| **පුහුණු කිරීම් හා හැකියා වර්ධනය** | | | | |
| 177-01-02-2401 | අමාත්‍යාංශ පරිපාලනය | 600,000.00 | 409,798.00 | 68 |
| 177-02-03-2401 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 1,500,000.00 | 1,177,564.36 | 78 |
| | **උප එකතුව** | **2,100,000.00** | **1,587,362.36** | **76** |
| | **මුළු එකතුව** | **358,115,000.00** | **212,615,581.05** | **59** |

## 3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර

| ණය වර්ගය | ණය ලබාගෙන ඇති නිලධාරින් ගණන | වැය වූ මුදල රු. |
|---|---|---|
| ආපදා ණය | 117 | 10,121,658.50 |
| උත්සව අත්තිකාරම් | 628 | 3,140,000.00 |
| විශේෂ අත්තිකාරම් | 109 | 272,500.00 |
| ගංවතුර අත්තිකාරම් | - | - |
| පාපැදි ණය | 01 | 6,000.00 |
| | එකතුව | **13,540,158.50** |

# 4. සංස්කෘතික ප්‍රවර්ධනය

## 4.1. සංස්කෘතික ප්‍රවර්ධන අංශයේ කාර්ය භාරය

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සියලුම සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංස්කෘතික ප්‍රවර්ධන අංශය මඟින් සිදු කරයි. සාරධර්ම පිරි සමාජයක් බිහිකිරීමට අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධන අංශය සතු ප්‍රධාන වගකීම වේ. මේ කාර්ය සඳහා දිවයින පුරා ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන 160 ක් 2012 වන විට පිහිටුවා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන අතර දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා එක් මධ්‍යස්ථානය බැගින් ආරම්භ කිරීමට අපේක්ෂිතය. මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදල,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කලා මණ්ඩලය, ටවර් හෝල් රඟහල පදනම, හා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වැනි ආයතනවල අමාත්‍යාංශ සම්බන්ධීකරණය පිළිබඳ කටයුතු මෙම අංශය මඟින් සිදු කරයි. ඒ අනුව පහත සඳහන් ප්‍රධාන රාජකාරි කටයුතු සංස්කෘතික ප්‍රවර්ධන අංශය මඟින් ඉටුකරයි.

## 4.2. සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු

**ප්‍රධාන කාර්යයන්**

- ප්‍රාදේශීය මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, ඒවා පවත්වාගෙන යාම හා එමඟින් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සංස්කෘතික සේවා සැපයීම සිදු කරනු ලැබේ.
- සාරධර්ම පිරි සමාජයක් බිහි කිරිම.
- ජාතික උරුමයන් සුරැකීම.
- සංස්කෘතික සමාජ පිහිටුවීම.

## 4.3 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන

මේ යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් සංස්කෘතික මධ්‍යස්ථානය බැගින් පිහිටුවීම අපේක්ෂා කෙරේ.

**අරමුණු**

- සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීම
- ප්‍රාදේශීය දරුදැරියන්ගේ කලා කුසලතාවයන් ඔප් නැංවීම
- ඉපැරණි කලාවන් හා කලා අංග එනම්, සුසැට කලාවන් යළිත් හඳුන්වාදී ප්‍රවර්ධනය කිරීම
- විදේශීය නර්තන ප්‍රසංග අත්දැකීම් ලබා දී ඔවුන් අන්තර්ජාතික තලයට ගෙන ඒම

◈සංස්කෘතික මධ්‍යස්ථාන වලින් ලබාදෙන සේවාව වඩාත් පුළුල් කිරීමේ අරමුණින් එම මධ්‍යස්ථානවලට පැමිණීමට ප්‍රවාහන දුෂ්කරතා ඇති ග්‍රාමීය ජනතාවට ද, එම සේවාවන් ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රදේශවලට එම ප්‍රදේශයේ වන සංස්කෘතික මධ්‍යස්ථානයට අනුබද්ධව ග්‍රාමීය සමාජ ද පිහිටුවා ඇත.

**4.3.1 සංස්කෘතික මධ්‍යස්ථාන වලින් නොමිලේ පුහුණුව ලබාදෙන සෞන්දර්ය හා අනිකුත් කුසලතා සංවර්ධන වැඩසටහන්**

- උඩරට නැටුම්
- පහතරට නැටුම්
- සබරගමු නැටුම්
- ජන නැටුම්
- නිර්මාණාත්මක නැටුම්
- බෙර වාදනය
- පෙරදිග සංගීතය
- අපරදිග සංගීතය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර හා මූර්ති
- පෙර පාසල්
- කායික හා මානසික වර්ධනය
- අත්කම්
- සිංහල භාෂාව
- දෙමළ භාෂාව
- පාලි හා සංස්කෘත භාෂාව
- ඉංග්‍රීසි භාෂාව

2012 වසර වන විට සංස්කෘතික මධ්‍යස්ථාන වලින් පුහුණුව ලබන සිසුන් සංඛ්‍යාව 35,280 ඉක්මවයි.

**4.3.2 සංස්කෘතික මධ්‍යස්ථාන විසින් තම ප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන්**

- ජාතික වැඩසටහන්
- ප්‍රාදේශීය සංස්කෘතික වැඩසටහන්
- ප්‍රාදේශීය ආගමික වැඩසටහන් (වෙසක් හා පොසොන් උත්සව)
- ප්‍රාදේශීය විශේෂ වැඩසටහන්
- ප්‍රාදේශීය සෞඛ්‍ය වැඩසටහන්

**4.3.3 ජාතික වැඩසටහන්/විශේෂ වැඩසටහන් සඳහා ලබාදිය හැකි නර්තන අංග සහ ශිල්පීන්**

| *නර්තන අංගය* | *සැපයිය හැකි ශිල්පීන් ගණන* | |
|---|---|---|
| | නර්තන ඇඳුම් /භාණ්ඩ සහිතව | නර්තන ඇඳුම් /භාණ්ඩ රහිතව |
| උඩරට නර්තන අංග | | |
| වෙස් නැටුම් | **500** | **1,000** |
| ශාස්ත්‍රීය කාන්තා | **300** | **1,000** |
| පහතරට නර්තන අංග | | |
| පහත රට නැටුම් කාන්තා | **100** | **400** |
| පහත රට නැටුම් පිරිමි | **-** | **500** |
| තෙල්මෙ | **50** | **450** |
| මුහුණු නැටුම් | | |
| කෝලම්, සන්නි හා පාලි - වර්ග 03 | **60** | **200** |
| **සබරගමු නර්තන අංග** | | |
| සබරගමු නැටුම් කාන්තා | **200** | **400** |
| සබරගමු නැටුම් පිරිමි | **100** | **250** |
| ගැමි නර්තන | | |
| ගැමි නර්තන අංග 20 ක් හා කණ්ඩායම් 25 කින් යුක්තය | | |
| | ශිල්පීන් 40 බැගින් සිටින කණ්ඩායම් 12 | කණ්ඩායම් 50 |
| බෙර වාදන ශිල්පීන් | **1,500** | **2,000** |

## 4.4. අංගම් සටන් ශිල්ප කලාව ව්‍යාප්ත කිරීම

**අරමුණ**

ශ්‍රී ලංකාවේ වසර 2500කට වැඩි දිගු ඉතිහාසයකට හිමිකම් කියන අංගම්පොර සටන් ශිල්ප කලාව ප්‍රගුණ කරන ලද සටන් ශිල්පීන් හඳුනාගෙන, එම ශිල්පය ආරක්ෂා කිරීම, අනාගත පරපුරට දායාද කිරීම හා සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වන්නේය.

දේශීය වශයෙන් වර්තමානයේ අංගම්පොර සටන් කලාව ප්‍රගුණ කරන ශිල්පීන් රාජ්‍ය අනුග්‍රහය යටතේ ඒකරාශි කොට අංගම්පොර ශිල්පය රට පුරා ව්‍යාප්ත කරමින් එම ශිල්පය ප්‍රවර්ධනයට වැඩසටහන් පැවැත්වීම හා මෙමගින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් රටට කීර්තියක් ලබා ගැනීමටත් අපේක්ෂිතය.

**ක්‍රියාකාරකම් - 2012**

- අංගම් සටන් ශිල්ප කලා සංගමය වෙත සංදර්ශන සඳහා අවශ්‍ය බෙර, දවුල් ආදිය ලබාදීම.
- 2012.02.08 දින දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ප්‍රධාන වේදිකාවේදී අංගම් සටන් ශිල්ප ප්‍රදර්ශනයක් පැවැත්වීම
- 2012 ජූනි මස මාතර හක්මන ප්‍රාදේශීය සභා ක්‍රීඩා භූමියේදී අංගම් සන්දර්ශනයක් පැවැත්වීම.

## 4.5 ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

වේගයෙන් අභාවයට යමින් පවතින ආදිවාසී ජනයාගේ සොබාදහම සමග බැඳී ජීවන රටාව,වෙද හෙදකම් ආදී පැරණි දැනුම, සිරිත් විරිත්, ශාන්ති කර්ම, ජන ගායනා, භාෂා සාහිත්‍ය, කලාත්මක හැකියාවන් ආදී වූ සංස්කෘතිකාංග සංරක්ෂණය කිරීම මෙහි අරමුණයි.

**මූලික කාර්යයන් හා ප්‍රගතිය**

| අරමුණ | ක්‍රියාකාරකම් | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|
| **1. ආදිවාසීන්ගේ කලාංග සංරක්ෂණය කිරීම** | වැදි ජනතාවගේ සංස්කෘතික අවශ්‍යතාවය,දෘෂ්‍යාත්මක සංස්කෘතිය, චර්යාත්මක ප්‍රකාශනය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය. | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුරාවිද්‍යාත්මක අධ්‍යයන කටයුතු අවසන් කොට ඇත.(2011) |
| **2. වේගයෙන් අභාවයට යන ආදිවාසී සංස්කෘතිය රැක ගැනීම.** | වැදි ජනයා පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණය. | කොළඹ විශ්වවිද්‍යාලය | සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.(2011) |
| **3.ආදිවාසීන්ගේ පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම.** | 1. ආදිවාසීන්ගේ පාරම්පරික වෙදකම පිළිබඳ අධ්‍යයනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>2. ආදි වාසීන්ගේ පාරම්පරික ආහාර රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම හා ප්‍රවර්ධනයට කටයුතු කිරීම. | ආයුර්වේද පර්යේෂණ ආයතනය | සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. **ආදිවාසීන්ට** බෙහෙත් පැලැටි වගාකිරීමට අවශ්‍ය ආධාර ලබා දී ආදායම් ලබා ගැනීමට සලස්වා ඇත.(2011) |

| | | | |
|---|---|---|---|
| **4.ආදිවාසීන්ගේ ඉල්ලීම මත ඔවුන් සඳහා නිවාස තැනීම.** | 1. අම්පාර - පොල්ලෙබැද්ද - නිවාස 30<br>2. අම්පාර - හෙනානිගල - නිවාස 20<br>3. මොණරාගල - රතුගල - නිවාස 20<br>4. වාකරේ - කුංචකුලම් - නිවාස 30 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය | **2012.12.31 වන විට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස ගණන 66** |
| **ප්‍රගතිය 2012** | | | |
| **2012 වර්ෂයේදී දඹාන හා දළුකාන ආදිවාසී ගම්මාන වල ආදිවාසීන් සඳහා තවත් නිවාස 55 ක් සාදා දීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත.**<br>**මහියංගනය - දඹාන නිවාස 25**<br>**දිඹුලාගල - දළුකාන නිවාස 30** } **ඇස්තමේන්තුගත මුදල රු.මි. 7.11** | | | |
| **◈ ව්‍යාපෘතියේ 1,2 හා 3 යන අරමුණු යටතේ සිදු කරන ලද පර්යේෂණ වලට අදාළව පහත සඳහන් ග්‍රන්ථ සම්පාදනය සිදු කර ඇත.**<br>1. වැද්දා - වැදි ජන පර්යේෂණ, සාහිත්‍ය විමර්ශන සහ තොරතුරු නාමාවලිය (ප්‍රේමකුමාර ද සිල්වා, චින්තක රණසිංහ)<br>2. ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ පාරම්පරික උරුමය (දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව)<br>3. Rock Paintings and Engraving Sites in Sri Lanka (Raj Somadeva)(PGIAR) | | | |

## 4.6 ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය

ශ්‍රී ලාංකික ජන ජීවිතය සමග ඒකාබද්ධව, අනාදිමත් කාලයක සිට පැවතෙමින් තිබෙන ජන ගායනා, ඒවායේ නාද මාලා සහ හේවිසි, වන්නම්, පූජා යාතු කර්මවල එන නාදමාලා ආදී ජන උරුමයන් වර්තමාන සමාජයෙන් සීඝ්‍රයෙන් බැහැරවීමේ තර්ජනයට මුහුණ දී ඇත. ලාංකික සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයක් වූ මෙම කලාංගයන් පිළිබඳ තොරතුරු අභාවයට යා නොදී ආරක්ෂා කර එය අනාගතයේදීත් ජනතාවගේ ජීවිතයට බද්ධ කරලීම මගින් ජනතාවගේ රසවින්දන ශක්තීන් පුළුල් වනු ඇත. ඒ අනුව ඉහත ජන සංගීත කලාංග හා ඒවායේ නාදමාලා සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් නවීන තාක්ෂණයෙන් යුක්ත පරිගණක තාක්ෂණික උපකරණ පද්ධතියකින් සමන්විතව ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයක් ජෝන් ද සිල්වා සමරු රඟහලේ සහ කලා භවන පරිශ්‍රයේ 2010 සැප්තැම්බර් 23 වන දින ආරම්භ කරන ලදී. මෙම පුස්තකාලය පිහිටුවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දෙනු ලැබුවේ රාජකීය නෝර්වේජියානු රජයයි.

**මූලික කාර්යයන්**

- දැනට රටේ විවිධ ප්‍රදේශවල මහජනයා සතුව සහ විවිධ ආයතන සතුව විසිරී පවතින ඉහත කලාංග සොයා ගොස් තොරතුරු ඒකරාශී කිරීම
- එම තොරතුරු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පටිගත කිරීම සහ සංරක්ෂණය කිරීම
- අධ්‍යයන සහ පර්යේෂණ අවශ්‍යතාවන් උදෙසා භාවිතයට ඉඩ ලබාදීම
- ඉහත දැනුම සමාජගත කිරීමට අවශ්‍ය ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම.

### 4.6.1 ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය - දෘෂ්‍ය පටිගත කිරීම්වල ප්‍රගතිය (2012)

| | | ශ්‍රව්‍ය පටිගත් කිරීම්වල ප්‍රගතිය | | | ශ්‍රව්‍ය - දෘෂ්‍ය පටිගත කිරීම්වල ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | ආයතන/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ජන ගී සංඛ්‍යාව | | | අයිතම සංඛ්‍යාව |
| | | පටිගත කරන ලද | සංස්කරණය කරන ලද | සංරක්ෂණය කරන ලද | |
| **1** | 2011 වර්ෂයේදී පටිගතකරන ලද, සංස්කරණය කරන ලද හා සංරක්ෂණය කරන ලද ජන සංගීත අංග | 1155 | 126 5 | 860 | |
| | **ප්‍රගතිය - 2012** | | | | |
| **2** | **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් ලබා ගත් අංග**<br>සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ජන සංගීත අංශයේ ඇති පැරණි තාක්ෂණික ක්‍රමවේදයකට අනුව පටිගත කොට ගබඩා කර ඇති කැසට්පට හා ඩැට් වර්ගයේ පට රැගෙනවිත්, ඩිජිටල් පටිගත කිරීමකට ලක්කොට සංරක්ෂණය කිරීම. | 141 | 141 | 141 | |
| **3** | **හාරිස්පත්තුව**<br>නුවර දළදා පෙරහැර හා සම්බන්ධ වන ප්‍රධාන වෙස් නර්තන ශිල්පියා ඇතුළු කලාකරුවන් ද බෙර වාදනයට සම්බන්ධවන ශිල්පීන් ද කාන්තා පාර්ශවයේ ජන ගී ගායනයට දක්ෂතා දක්වන පිරිස් ද සහභාගී කර ගන්නා ලදී. | 67 | 67 | 67 | වැඩසටහන් අවස්ථා 03 |
| **4** | **බලපිටිය**<br>බලපිටිය ප්‍රදේශයේ තිබුණු නාඩගම් හා නූර්ති යන නාටක වලට සම්බන්ධව සිටි පැරණි ශිල්පීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමක් ද සහිතව එම නාදමාලා පටිගත කිරීම. | 39 | 39 | 39 | 39 |
| **5** | **ගාල්ල සංගීත උළෙල**<br>මෙය කොන්සර්ට් ආයතනයේ සේවා ලංකා පදනමේ සංවිධානයෙන් ගාල්ලේ පැවැති සංගීත උළෙලයි. මෙම විවිධත්වයෙන් යුතු සංගීත උළෙල පටිගත කොට එම අංග සංරක්ෂණය සිදුකරන ලදී. | 38 | 38 | 38 | 38 |
| **6** | දෘශ්‍ය කලා විශ්වවිද්‍යාලයෙන් කැසට් පටි 15 ක් ලබා ගැනීම | කැසට් පටි 5 | | 5(4 GB) | |
| **7** | කැසට් පටි 21 ක් ලබා ගැනීම | 11 | | 11 | |
| **8** | දෘශ්‍ය කලා විශ්වවිද්‍යාලයෙන් ඩැට් ගොනු 36ක් ලබා ගැනීම | 5 | 21 | 5 | |
| **9** | **හඟුරන්කෙත**<br>නෙළුම් කවි, ඇතුළු ජන ගී සහ දේවාලය ආශ්‍රිත හේවිසි මාලා පටිගත කර ගන්නා ලදී. | 82 | 71 | 71 | 71 |
| **10** | **නුවරඑළිය - ඌල් ඔය තේ වත්ත (දෙමළ ජන කවි)**<br>නුවර එළිය ඌල් ඔය තේ වතුයායේ වෙසෙන තේ දළු කැඩීම හා ඒ ආශ්‍රිත රැකියාවන් ජීවනෝපාය කරගත් දෙමළ ජනතාවගේ ජන ගී, ජන නාට්‍ය වල නාදමාලා පටිගතත කරන ලදී. මේවා දකුණු ඉන්දියානු සම්භවයක් ඇති ජන සංගීත අංග වෙයි. | 16 | 13 | 13 | 13 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **11** | **දඹාන ආදිවාසී ජනයාගේ ජන නැටුම් හා බෙර වාදන**<br>ශ්‍රී ලංකාවේ ආදිවාසි ප්‍රජාව වන වැදි ජනතාවගේ හැත්මේ නම් ශාන්තිකර්මය ඒ හා බැඳි චාරිත්‍ර විධි, නාදමාලා, පටිගත කෙරිණි. | සම්පූර්ණ රාත්‍රියක සංදර්ශනයකි. සංස්කරණ කරමින් පවතී. | | | (සවස සිට රැය පහන් වී පසුදා සවස් වන තුරු පැවතුනු ශාන්තිකර්මය) |
| **12** | මහියංගනය පෙරහැරට සම්බන්ධ වැදි ජනතාවගේ දොඩං පෙරහැර හා ඒ ආශ්‍රිත චාරිත්‍ර විධි | | | | |
| **13** | **ගම්පහ පත්තලගෙදර සියනෑ විද්‍යා පීඨයේදී පැවති ජාතික සාහිත්‍ය උත්සවයේදී සහෘද නාලිකාව නමින් පාසල් ළමයින් ඉලක්ක කරගත් ගුවන්විදුලි නාලිකාවක් ක්‍රියාත්මක කිරීම**<br>ජන සංගීත සංරක්ෂණ ප්‍රචලිත කිරීමත් එහි ප්‍රතිලාභ සමාජ ගත කිරීමත් අරබයා, සංස්කෘතික ගුවන් විදුලි නාලිකාවක් පවත්වන ලදී. | සජීවී වැඩසටහන් පටිගත කිරීම | | | |
| **14** | **මරු මංගල්‍යය නම් හොරණ ප්‍රදේශයට ආවේණික බලි ශාන්තිකර්මය** | 08 | - | 06 | පැය 12 - කැමරා 03ක දර්ශන (වැඩ.ස. පැය 06) |
| **15** | **කෝළම් ශාන්තිකර්මය පටිගත කිරීම.**(ජාතික පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි.) | 12 | 08 | 08 | පැය 22 - කැමරා 03ක දර්ශන (වැඩ.ස. පැය 07) |
| **16** | **දහඅට සන්නිය ශාන්ති කර්මය පටිගත කිරීම.**(රාගම වෛද්‍යපීඨ පරිශ්‍රයේදී පැවැත්විණි) | 11 | 06 | 06 | පැය 22 - කැමරා 03ක දර්ශන (වැඩ.ස. පැය 10) |
| **17** | සම්ප්‍රදායික වෙස් බැඳීමේ මංගල්‍යය<br>යාපහුව රාජධානිය පසුබිම්කොට ගෙන දහසකට වෙස් හා පායිම්පත් පැළඳවීම සිදුවිනි. | | | | පැය 07 - කැමරා 02ක දර්ශන (වැඩ.ස. පැය 3) |
| **18** | රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායමේ ප්‍රභාෂ්වර ප්‍රසංගය පටිගත කිරීම | | | | පැය 04 - කැමරා 02ක දර්ශන (වැඩ.ස. පැය 1.30) |
| **19** | දීපවාලී උත්සවය හා බැඳි සංගීතය<br>විෂ්ණුකෝවිල - නැදිමාල | | | | පැය 2.30 (වැඩ.ස. පැය 0.40) |
| **20** | මරු මංගල්‍යය මරුවලිය නම් හොරණ ප්‍රදේශයට ආවේනික ශාන්තිකර්මය පටිගත කිරීම | | | | පැය 12 - කැමරා 03ක දර්ශන (වැඩ.ස. පැය 6.00) |

## 4.7. 2012 වසර තුළ පවත්වන ලද වෙනත් වැඩසටහන්

| දිනය | වැඩ සටහන හා පැවැත්වූ ස්ථානය | සිදු කරන ලද ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| **2012.02.04** | ජාතික නිදහස් දින සැමරුම - අනුරාධපුරය | නර්තන පෙරහැර සඳහා නර්තන ශිල්පීන් 2000 සහභාගි කරවීම | මහජනතාව සහ විදේශ නියෝජිතයින් |
| **2012.02.04 සිට 12 දක්වා** | දැයට කිරුළ ප්‍රදර්ශනය - ඔයාමඩුව | නර්තන ප්‍රසංග හා ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීම (අංගම්, ලී කැටයම්, පන් ආශ්‍රිත නිර්මාණ, ජ්‍යෝතිෂ සායන) | මහජනතාව |
| **2012.03.08** | සෙනෙහස වැඩ සටහන - සෙත්සිරිපාය | නැළවිලි ගී රසවින්දන සායනයක් පැවැත්වීම. | සෙත්සිරිපාය පරිශ්‍රයේ සිටින ගැබිණි මාතාවන් 75 (රාජ්‍ය සේවකයින්) |
| **2012.03.28** | සෙනෙහස වැඩ සටහන (ජාතික වැඩ සටහන) - කහටගස්දිගිලිය | නැළවිලි ගී රසවින්දන සායනයක් පැවැත්වීම හා පෝෂණ මල්ලක් ලබාදීම | කහටගස්දිගිලිය ප්‍රදේශයේ ගැබිණි මාතාවන් සහ මහජනතාව |
| **2012.04.06** | සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවයේ නැකැත් සීට්ටු බෙදාදීම - අරලියගහ මන්දිරය | සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් වාර්ෂිකව සකස් කරනු ලබන අලුත් අවුරුදු නැකැත් සීට්ටුව අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම | අතිගරු ජනාධිපතිතුමා සහ මහජනතාව |
| **2012.04.24** | අවුරුදු උත්සවය - ජන කලා කේන්ද්‍රය | සිංහල, දෙමළ ජන ක්‍රීඩා, සංස්කෘතිකාංග ඇතුළත් අවුරුදු උත්සවයක් පැවැත්වීම | සංස්කෘතික අමාත්‍යාංශය හා යටතේ ඇති ආයතන සේවකයින් |
| **2012.04.29** | ලෝක නර්තන දිනය - මුතියංගණ රජ මහා විහාරය | ඌව පළාතේ සං.ම. ශිල්පීන් 150 හිස වෙස් තැබීමේ මංගල්‍යය | මහජනතාව |
| **2012.05.06** | 2600 සම්බුද්ධත්ව ජයන්ති අවසන් උත්සවය - මහනුවර දළදා මාළිගාව | බෙර සංධ්වනියක් පැවැත්වීම | මහජනතාව |
| **2012.05.11** | බුද්ධ රශ්මි වෙසක් කලාපය - අරලියගහ මන්දිරය සහ ගංගාරාම විහාරස්ථානය | සංස්කෘතික සංදර්ශනයක් ප.ව. 7.00 සිට අළුයම 2.00 දක්වා පැවැත්වීම | මහජනතාව |
| **2012.06.03** | රුහුණු මහා සංස්කෘතික පෙරහැර - තිස්සමහාරාම විහාරස්ථානය | නර්තන පෙරහැර සඳහා නර්තන ශිල්පීන් 150 ක් සහභාගී කරවීම | මහජනතාව |
| **2012.06.04** | පොසොන් උත්සවය - ඓතිහාසික මිහින්තලේ රජ මහා විහාරය | හේවිසි වාදන ශිල්පීන් 30 ක් සහභාගී කරවීම | මහජනතාව |
| **2012.06.05** | ලස්සන හක්මණ ජාතික පොසොන් කලාපය - හක්මණ | නර්තන පෙරහැර සඳහා නර්තන ශිල්පීන් 800 සහභාගි කරවීම, අංගම් සටන් ශිල්ප සංදර්ශනයක් පැවැත්වීම හා සත්පත්තිනි ශාන්ති කර්මයක් පැවැත්වීම | මහජනතාව |

| | | | |
|---|---|---|---|
| **2012.08.09** | ලෝක ආදිවාසී දිනය සැමරීම - දඹාන ආදිවාසී ගම්මානය | තිසාහාමිගේ පිළිරුව විවෘත කිරීම වරිග සභාව පැවැත්වීම.<br>ගොවි උපකරණ බෙදා දීම.<br>පැල බෙදා දීම.<br>වෛද්‍ය සායන පැවැත්වීම හා ආදිවාසින් විසින් නිෂ්පාදනය කරන ලද දේශීය ඖෂධ මිලදී ගැනීම. | ආදිවාසීන් සහ මහජනතාව |
| **2012.08.19** | කපිල වස්තු ධාතු ප්‍රදර්ශනය - කැලණිය මානෙල්වත්ත විහාරය | බෙර ශිල්පීන් 200කගේ හේවිසි වාදනය | මහජනතාව |
| **2012.08.21 හා 23** | මාලදිවයින් හා සීෂෙල් රාජ්‍ය නායකයින් පිළිගැනීම - ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට | බෙර ශිල්පීන් 300කගේ බෙර සංධ්වනිය | විදේශ රාජ්‍ය නායකයින් හා ජනතාව |
| **2012.09.07** | කපිල වස්තු ධාතු ප්‍රදර්ශනය - ගංගාරාම විහාරස්ථානය | බෙර ශිල්පීන් 300කගේ හේවිසි වාදනය | මහජනතාව |
| **2012.09.09** | අන්තර් සං.ම. ප්‍රතිභා ජාතික තරඟය පැවැත්වීම - මාලඹේ ශ්‍රී රාහුල කාන්තා හා පිරිමි විද්‍යාල | නර්තන හා සංගීත තරඟ පැවැත්වීම | සංස්කෘතික මධ්‍යස්ථාන දූ දරුවන් |
| **2012.09.11** | 58 වන පොදු රාජ්‍ය මණ්ඩල පාර්ලිමේන්තු සමුළුව - නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල | බෙර ශිල්පීන් 300කගේ බෙර සංධ්වනිය | විදේශ රාජ්‍ය නායකයින් හා මහජනතාව |
| **2012.10.22** | ලෝක ළමා දින වැඩසටහන - හොරණ නගර සභා ක්‍රීඩා පිටිය | පෙරපාසල් ළමුන් 1000කගේ සහභාගීත්වයෙන් ලෝක ළමා දින ජාතික වැඩසටහන පැවැත්වීම | ළමුන්සහ මහජනතාව |
| **2012.11.13** | උගන්ඩා ජනාධිපති පිළිගැනීම - ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට | බෙර ශිල්පීන් 250 ගෙන් සමන්විත බෙර සංධ්වනියක් පැවැත්වීම | විදේශීය ආරාධිතයින් |
| **2012.11.15** | ජාතික රුක්රෝපණ දිනය සැමරීම - බත්තරමුල්ල | බෙර ශිල්පීන් 30ක් සහභාගි කරවීම | මහජනතාව |
| **2012.12.04** | අන්තර් සංස්කෘතික මධ්‍ය ප්‍රතිභා නාට්‍ය තරඟාවලිය සම්මාන ප්‍රදානය අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සම්මාන ප්‍රදානය - ජාතික කෞතුකාගාර ශ්‍රවනාගාරය | අදියර 04කින් යුත් සම්මාන ප්‍රදානය සහ සංස්කෘතිකාංග ඉදිරිපත් කිරීම | මහජනතාව |
| **2012.12.19** | නත්තල් දින සැමරුම් වැඩසටහන - අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | නත්තල් ගීතිකා ගායනය, නත්තල් ක්‍රීඩා පැවැත්වීම සහ බත්තරමුල්ල පල්ලියට ආධාර ලබාදීම | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය |
| **2012.12.21** | රාජ්‍ය ජ්‍යොතිර් විද්‍යා සම්මාන ප්‍රදානය - ජෝන් ද සිල්වා සමරු රඟහල | ප්‍රවීණ ජ්‍යොතිර්වේදීන් 07 දෙනෙකුට විභූෂණ සම්මානය ද 19 දෙනෙකුට රත්න සම්මානය ද ප්‍රදානය කරන ලදී. | ජ්‍යොතිර්වේදීන් |

## 4.8. රසවින්දන වැඩසටහන් පැවැත්වීම

**අරමුණ -** දිවයින පුරා විසිරී සිටින පාසල් ළමයින්ගේ සහ තරුණ තරුණියන්ගේ පොදුවේ ප්‍රජාවගේ සෞන්දර්යාත්මක රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම මගින් සංවේදී මිනිසුන්ගෙන් පිරි සමාජයක් බිහිකිරීම.

**ක්‍රියාත්මක කිරීම -** වසර පුරා තෝරාගත් පාසල් සහ විශේෂ ඉල්ලීම් සිදු කරන ආයතන සඳහා මෙම රස වින්දන වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහිදී අදාළ සෞන්දර්ය හෝ සාහිත්‍ය විෂයෙහි පළපුරුදු සම්පත්දායකවරයකුගේ මූලිකත්වයෙන් වැඩමුළුවක් පැවැත්වේ.

**ක්‍රියාකාරකම්-**

- උසස් කලා කෘති වින්දනය මානව වටිනාකම් මතුකර ගැනීම සඳහා බලපාන ආකාරය සාකච්ඡා කිරීම.
- මානව ජීවිතයට මුහුණදීමට සිදුවන පෞද්ගලික ගැටලු හා ජීවිතයේ බිඳ වැටීම් සඳහා ශක්තිමත්ව මුහුණ දීමට කලා රසවින්දනය බලපාන ආකාරය නිදර්ශනාත්මකව පැහැදිලි කිරීම.
- සාහිත්‍ය හා කලාව රසාස්වාදයට යොමුවීමේ ශික්ෂණය සමාජගල කිරීම.
- නාඩගම්, නූර්ති, නව නාට්‍ය නිර්මාණ හා එම නාට්‍ය ගීත රසාස්වාදනයට යොමු වීම.
- සාම්ප්‍රදායික ගැයන ස්වරූප හා සුභාවිත ගීතය පිළිබඳ හැඳින්වීම.
- ප්‍රබුද්ධ ගීතයක සමුදාර්ථමය ප්‍රකාශනය සඳහා ගේය පද, සංගීත සංයෝජනය හා ගායනවේදයේ නිර්මාණශීලී ප්‍රවේශය හඳුනා ගැනීම.
- ගීතය, සංගීතය හා ජීවිතය පිළිබඳ කතිකාවකට යොමු වීම.

### 4.8.1 රසවින්දන වැඩසටහන් 2012 වසර පුරා පවත්වන ලද ආකාරය

| | දිනය | ස්ථානය |
|---|---|---|
| 1. | 2012.01.17 | කැකිරාව තිබ්බොටුව මහා විද්‍යාලය |
| 2. | 2012.01.17 | කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 3. | 2012.01.18 | රාජාංගනය යාය 05 නවෝදා පාසල |
| 4. | 2012.01.18 | රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 5. | 2012.01.19 | අනුරාධපුර නිවන්තචෛතිය මහා විද්‍යාලය |
| 6. | 2012.01.19 | මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 7. | 2012.01.20 | තිරප්පනේ මහා විද්‍යාලය |
| 8. | 2012.01.20 | තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 9. | 2012.01.24 | නොච්චියාගම මාරගහවැව මහා විද්‍යාලය |
| 10. | 2012.01.24 | මුදිතාගම ප්‍රජා ශාලාව |
| 11. | 2012.01.25 | හොරොව්පතාන රුවන්වැලි මහා විද්‍යාලය |
| 12. | 2012.01.25 | හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 13. | 2012.01.26 | ගලෙන්බිදුණුවැව මහා විදුහල |
| 14. | 2012.01.26 | ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 15. | 2012.01.27 | කහටගස්දිගිලිය මධ්‍ය මහා විද්‍යාලය |
| 16. | 2012.01.27 | කහටගස්දිගිලිය සංස්කෘතික මධ්‍යස්ථානය |
| 17. | 2012.02.15 | බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 18. | 2012.02.21 | ඇඹිලිපිටිය සංස්කෘතික මධ්‍යස්ථානය |
| 19. | 2012.02.03 | වෙයන්ගොඩ සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය |
| 20. | 2012.02.23 | කහටගස්දිගිලිය ශ්‍රී විවේකාරාම විහාර පරිශ්‍රය (සෙනෙහස වැඩසටහන) |
| 21. | 2012.04.02 | දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානය |
| 22. | 2012.04.08 | බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානය |

| | | |
|---|---|---|
| **23.** | 2012.04.30 | ගෝණපිණුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **24.** | 2012.04.30 | ගෝණපිණුවල සාරාලංකාර මහා විදුහල |
| **25.** | 2012.05.20 | බෝගම්බර බන්ධනාගාරය |
| **26.** | 2012.05.20 | බෝගම්බර රිමාන්ඩ් බන්ධනාගාරය |
| **27.** | 2012.05.28 | මාතලේ කයිකාවල මහා විදුහල |
| **28.** | 2012.06.18 | ඇල්පිටිය මහා විද්‍යාලය |
| **29.** | 2012.06.18 | බැද්දේගම, කිරිබතාවිල ශ්‍රී අමරවංශ මහා පිරිවන |
| **30.** | 2012.06.02 | හතරලියැද්ද මධ්‍ය මහා විද්‍යාලය |
| **31.** | 2012.06.02 | හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **32.** | 2012.08.07 | නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය |
| **33.** | 2012.08.10 | මීරිගම හාපිටිගම ජාතික අධ්‍යාපන පීඨය |
| **34.** | 2012.09.07 | වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානය |
| **35.** | 2012.09.24 | ගම්පහ යශෝධරා බාලිකා විද්‍යාලය |
| **36.** | 2012.10.12 | උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

මෙම රසවින්දන වැඩසටහන් සඳහා මහජනතාව, විශේෂයෙන් තරුණ කොටස් විශාල වශයෙන් සහභාගි විය.

## 4.9 සංස්කෘතික ප්‍රවර්ධන අංශය මඟින් පවත්වන ලද වාර්ෂික පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහනේ නම | සහභාගීත්වය | ස්ථානය |
|---|---|---|---|
| **01.** | අස්පර්ෂ කලා උරුමය හා ජාතිකත්වය 2012.10.12 සිට 14 | සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 60 | වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය |
| **02.** | සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන්ගේ වගකීම් හා වර්තමාන කාර්යභාරය 2012.12.20 සිට 22 | සංසකෘතික ප්‍රවර්ධන නිලධාරීන් 55 | වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය |
| **03.** | සංස්කෘතික කලා උරුමය හා සාහිත්‍ය රස වින්දනය 2012.11.10 සිට 11 | සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 154 | ඇඹිලිපිටිය ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය |
| **04.** | සම්පත්දායක ශිල්පීය නිපුණතා වැඩමුළුව 2012.03.05 සිට 07 | සම්පත්දායකයින් 36 | වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය |
| **05.** | සම්පත්දායක ශිල්පීය නිපුණතා වැඩමුළුව 2012.04.01 සිට 03 | සම්පත්දායකයින් 65 | වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය |

## 4.10 මූල්‍ය ප්‍රගතිය - 2012

සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් හා සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන යටතේ සම්පත්දායක වැටුප්, ආදේශක වැටුප් හා සුළු මුදල් සඳහා 2012 වසරේ වැය වීම - රු.මි.99.88

## 4.11 අමාත්‍යාංශ වෙබ් අඩවිය නවීකරණය කිරීම.

නවීකරණය කරන ලද වෙබ් අඩවිය ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2012.01.26 වන දින ප.ව.2.00ට දියත් කිරීම සිදු කරන ලදී. මෙම කර්තව්‍යයට සමගාමීව පහත ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ වෙබ් අඩවිය තුළ මෙම අමාත්‍යාංශයට අයත් තොරතුරු ඇතුළත් කිරීම.
- ශ්‍රී ලංකා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය සඳහා මෙම අමාත්‍යාංශයේ තොරතුරු යාවත්කාලීන කිරිම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- අමාත්‍යාංශ වෙබ් අඩවියේ කටයුතු තවත් පුළුල් කිරිමේ අරමුණින් වෙබ් බිහිදොර සම්බන්ධ කිරිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම.

## 4.12 යුනෙස්කෝ වැඩමුළුව

අස්පර්ෂ සංස්කෘතික උරුමය සංරක්ෂණය හා යුනෙස්කෝ 2003 සම්මුතිය පිළිබඳව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා යුනෙස්කෝ ආයතනය එක්ව පස් දින වැඩමුළුවක් 2012 ජුනි 25 දින සිට 29 දින දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

## 4.13 ආයතන කටයුතු

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පහත ආයතන වල ආයතනික කටයුතු සිදු කරනු ලැබේ.

- මධ්‍යම සංස්කෘතික අරමුදල
- ටවර් හෝල් රඟහල පදනම
- ප්‍රසිද්ධ රඟුම්පාලක මණ්ඩලය

# 5. සංස්කෘතික යටිතල පහසුකම් සංවර්ධනය

අමාත්‍යාංශය සිය කාර්යයන් වඩාත් සීඝ්‍රව හා සමීපව ජනතාව අතරට ගෙනයාමට ප්‍රාදේශීය මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සිදු කර ගෙන යයි. මෙම කටයුතු සඳහා අමාත්‍යාංශය තුළම වෙනම අංශයක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඇතිවිය. ඒ අනුව 2011 වසරේ මුල් වරට ඉදිකිරීම් අංශයක් ස්ථාපනය කරන ලදී.

## 5.1. කාර්යභාරය

සාරධර්ම පිරිපුන් සමාජයක් බිහිකිරීමේ උදාර අරමුණ පෙරදැරි කරගෙන සහ දිවයිනේ සිටින ළමුන්ගේ කලා කුසලතාවයන් ඔප්නංවා ජාතික හා ජාත්‍යාන්තර තලයට ගෙන ඒමේ අරමුණින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහනක් සංස්කෘතික හා කලාකටයුතු අමාත්‍යාංශය විසින් දියත් කර ඇත. ඉදිකිරීම් අංශය ඒ අනුව සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සහ නඩත්තු කටයුතු කරනු ලැබේ.

## 5.2. මූල්‍ය ප්‍රගතිය

2012 වසරේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය - රු.මි. 129.47

**2012 වසර අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාප්තිය**

- මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ - 334
- ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන - 160
- ඉදිවෙමින් පවතින සං.ම. – 34

## 5.3 නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම - 2012

| පළාත | දිස්ත්‍රික්කය | මධ්‍යස්ථානයේ නම | 2012 දරණ ලද වියදම රු. |
|---|---|---|---|
| **2012 වර්ෂයේ විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන(4)** | | | **8,105,053.77** |
| ඌව | බදුල්ල | සොරණාතොට | - |
| බස්නාහිර | කළුතර | ඉංගිරිය | 3,848,113.00 |
| | කොළඹ | පාදුක්ක - රංග ශාලාව | 1,239,168.77 |
| දකුණ | ගාල්ල | වැලිවිට දිවිතුර | 2,965,060.00 |
| | | මොන්රෝවියා වත්ත - තාවකාලික මධ්‍යස්ථානය | 52,712.00 |
| **2012 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන(6)** | | | **29,197,199.26** |
| උතුරු මැද | අනුරාධපුරය | හොරොව්පතාන | 3,018,086.26 |
| | | කහටගස්දිගිලිය | 1,447,668.00 |
| | | අනුරාධපුර නිවාඩු නිකේතනය | ඉදිකිරීම් ම.ස.අ. මගින් සිදු කරනු ලබයි. |
| වයඹ | කුරුණෑගල | පොල්පිතිගම රංග ශාලාව | 3,165,000.00 |
| දකුණ | හම්බන්තොට | වීරකැටිය | 11,566,445.00 |
| නැගෙනහිර | අම්පාර | ඉරක්කාමම් | 2,000,000.00 |
| | | නාවිත්තන්වෙලි | 2,000,000.00 |
| | | කුච්චවෙලි | 2,000,000.00 |
| උතුර | යාපනය | පොයින්ට්පේද්‍රු | 2,000,000.00 |
| | | චාවාකච්චේරි | 2,000,000.00 |

| පළාත | දිස්ත්‍රික්කය | මධ්‍යස්ථානයේ නම | 2012දරණ ලද වියදම රු. |
|---|---|---|---|
| **2012 වර්ෂයේ වැඩිදියුණු කිරීම් කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන(10)** | | | **5,424,835.00** |
| වයඹ | කුරුණෑගල | ඇහැටුවැව | 202,105.00 |
| | **පුත්තලම** | ආනමඩුව | 123,108.00 |
| දකුණ | මාතර | මුලටියන | 730,000.00 |
| නැගෙනහිර | වවුනියාව | මඩුකන්ද | 573,070.00 |
| බස්නාහිර | කොළඹ | හංවැල්ල | 1,944,176.00 |
| | කළුතර | හල්තොට | 438,805.00 |
| ඌව | බදුල්ල | ඌව පරණගම | 115,000.00 |
| මධ්‍යම | මහනුවර | හාරිස්පත්තුව | 242,164.00 |
| | | උඩුදුම්බර | 515,000.00 |
| | නුවරඑළිය | කොත්මලේ | 541,407.00 |
| **2012ට පෙර ඉදිකිරීම් ආරම්භ කර 2013 දක්වා ඉදිකිරීම් කටයුතු කෙරෙන සංස්කෘතික මධ්‍යස්ථාන(28)** | | | **84,800,541.00** |
| වයඹ | කුරුණෑගල | අඹන්පොල හාරසියගම | 2,000,000.00 |
| | | මහව නාගොල්ලාගම | 2,000,000.00 |
| | | උඩුබද්දාව | 1,954,958.00 |
| | පුත්තලම | පල්ලම | 1,657,264.00 |
| | | මහකුඹුක්කඩවල | 1,000,000.00 |
| සබරගමුව | රත්නපුර | වැලිගෙපොල | 1,000,000.00 |
| | | ඉඹුල්පේ | 2,000,000.00 |
| | කෑගල්ල | වරකාපොල | 1,324,024.00 |
| දකුණ | ගාල්ල | යක්කලමුල්ල | 1,900,000.00 |
| නැගෙනහිර | අම්පාර | කල්මුනේ - දෙමළ | 4,000,000.00 |
| | | කල්මුනේ - මුස්ලිම් | 4,000,000.00 |
| | ත්‍රිකුණාමලය | ගෝමරන්කඩවල | 2,155,950.00 |
| | | මොරවැව | 1,000,000.00 |
| ඌව | මොණරාගල | බඩල්කුඹුර | 196,391.00 |
| | | මඩුල්ල | 3,987,264.00 |
| | | මොණරාගල | 4,735,010.00 |
| | | සියඹලාණ්ඩුව | 6,751,095.00 |
| | | බිබිල | 1,831,396.00 |
| | බදුල්ල | ඇල්ල | 1,500,000.00 |
| | | රිදීමාලියැද්ද | 4,500,000.00 |
| උතුරුමැද | අනුරාධපුරය | ගල්නෑව | 1,809,916.00 |
| | | පලාගල | 1,486,344.00 |
| | | කැබැතිගොල්ලෑව | 2,000,000.00 |
| | | මහවිලච්චිය | 9,093,708.00 |
| උතුර | යාපනය | කරෙයිනගර් | 3,522,111.00 |
| | | උඩුවිල් | 2,397,110.00 |
| | | තෙලිප්පලෙයි | 5,000,000.00 |
| | | වන්කානෙයි | 8,000,000.00 |


| **2012 වර්ෂයේ අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන(42)** | | | **1,941,451.31** |
|---|---|---|---|
| සබරගමුව | කෑගල්ල | කෑගල්ල | 34,400.00 |
| | | ගලිගමුව | 77,620.00 |
| | | රුවන්වැල්ල | 9,540.00 |
| | | නිවිතිගල | 49,960.00 |
| | රත්නපුරය | බලංගොඩ | 39,505.00 |
| නැගෙනහිර | වව්නියාව | වව්නියාව | 16,000.00 |
| | අම්පාර | පදියතලාව | 49,700.00 |
| | | අම්පාර දිස්. මධ්‍යස්ථානය | 99,000.00 |
| ඌව | මොණරාගල | තණමල්විල | 32,670.00 |
| | | බිබිල | 14,694.00 |
| බස්නාහිර | කොළඹ | විශ්ව විද්‍යාලය | 18,000.00 |
| | | පාදුක්ක | 90,935.00 |
| | කළුතර | පානදුර | 22,600.00 |
| | | කළුතර | 10,600.00 |
| උතුරු මැද | අනුරාධපුරය | නොච්චියාගම | 49,620.00 |
| | | ගලෙන්බිදුනුවැව | 28,500.00 |
| | | මධ්‍යම නුවරගම් පළාත | 73,810.00 |
| | | කැකිරාව | 112,050.00 |
| | | ගල්නෑව | 97,447.18 |
| | පොලොන්නරුව | හිඟුරක්ගොඩ | 99,127.12 |
| | | මැදිරිගිරිය | 73,915.00 |
| මධ්‍යම | මහනුවර | පාතදුම්බර | 86,269.00 |
| | | ගලගෙදර | 17,440.00 |
| | | කුණ්ඩසාලේ | 49,900.00 |
| | | පූජාපිටිය | 45,170.00 |
| | | දෙල්තොට | 38,500.00 |
| | | උඩුනුවර | 43,200.00 |
| | මාතලේ | ගලේවෙල | 52,144.88 |
| | | නාවුල | 56,278.32 |
| | | විල්ගමුව | 67,030.00 |
| | නුවරඑළිය | කොත්මලේ | 4,163.64 |
| දකුණ | ගාල්ල | ඇල්පිටිය | 56,450.00 |
| | | ඉමදූව | 48,700.00 |
| | මාතර | පිටබැද්දර | 87,050.00 |
| | | කිරින්ද පුහුල්වැල්ල | 47,625.00 |
| වයඹ | කුරුණෑගල | මල්ලවපිටිය | 46,550.00 |
| | | මාස්පොත | 22,280.00 |
| | | පොලිපිත්ගම | 23,200.00 |
| | | බමුනාකොටුව | 29,795.00 |
| | | ගිරිබාව | 2,752.00 |
| | | අලව්ව | 3,260.17 |
| | පුත්තලම | මහවැව | 14,000.00 |

## 5.4. දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කෙරෙන අනිකුත් ව්‍යාපෘති

### 5.4.1. සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම - හික්කඩුව

විදේශීය සංචාරකයින් බහුලව ගැවසෙන හික්කඩුව ප්‍රදේශයට ඔවුන්ට අවශ්‍යවන පහසුකම් (ශ්‍රී ලංකාවේ සංස්කෘතිකමය උරුම තොරතුරු පිළිබඳ වාර්තා චිත්‍රපට , දේශීය සංස්කෘතික හා කලා අංග පිළිබඳ දෘෂ්‍යපට ප්‍රදර්ශනය,විවිධ භාෂා වලින් රචිත පොත්පත් සහිත පුස්තකාල පහසුකම්,අන්තර්ජාල පහසුකම් ආදී නව තාක්ෂණික සේවාවන්) සහිත මධ්‍යස්ථානයක් පිහිටුවීම ප්‍රධාන අරමුණ කර ගෙන 2011 අගෝස්තු මාසයේදී මෙම සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

**මුළු ඇස්තමේන්තුගත වියදම**
**රු.මි. 353**
**(දේශීය අරමුදල්)**



**සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනයේ ආකෘතිය**

**ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අදියර 03 කින් සිදු කිරීමට නියමිතය.**

**1 අදියර -** සංස්කෘතික මධ්‍යස්ථානය, පුස්තකාලය, පරිපාලන කාර්යාලය

**2 අදියර -** ශ්‍රවණාගාරය, ආපන ශාලාව (විදේශීය සංචාරකයන්ට ද ගැලපෙන පරිදි පහසුකම් වලින් සමන්විත එකවර 100 කට පමණ සංග්‍රහ කල හැකි දේශීය ආහාර වලින් යුත් ආපන ශාලාව), අලෙවි කුටි

**3 අදියර -** නේවාසික පහසුකම්

**ප්‍රගතිය - 2012සංස්කෘතික මධ්‍යස්ථානය, පුස්තකාලය, පරිපාලන කාර්යාලය යන පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.**


**ප්‍රතිපාදන 2012 - රු.මි. 41.56** **මූල්‍ය ප්‍රගතිය 2012 - රු.මි.35**

**2012 හතරවන කාර්තුව දක්වා සමුච්චිත වියදම රු.මි. 61.076 කි.**

### 5.4.2. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය - මාතර, නාවිමන, මොරකැටියහේන

කලාපීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා නගා සිටුවීමත් විවිධ සම්ප්‍රදායන් හා උසස් සංස්කෘතික විවිධත්වයන් අතර සම්බන්ධතාවයන් ගොඩනැගීමත් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ මූලික අරමුණ වේ. මෙම මධ්‍යස්ථානය කලාපීය කලාකරුවන්ගේ ප්‍රධානතම රැස්වීම් මූලස්ථානය ලෙසත් කලාපීය සම්ප්‍රදායික කලාකරුවන් දිරිමත් කිරීමට හා ඔවුන්ට අනුග්‍රහය දැක්වීමට වැඩසටහන් හඳුන්වාදෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක වනු ඇත. 2011 ජුලි 21 සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

**මුළු ඇස්තමේන්තුගත වියදම**
**රු.මි. 500**
**(දේශීය අරමුදල්)**



**සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ ආකෘතිය**

**ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අදියර 03 කින් සිදු කිරීමට නියමිතය.**

**1 අදියර -** ප්‍රධාන ගොඩනැගිල්ල

**2 අදියර -** පුහුණු මධ්‍යස්ථානය

**3 අදියර -** නේවාසිකාගාර, විද්වතුන් සඳහා වන නිල නිවාස, SAARC රටවල් සඳහා වෙන වෙනම නිවාස

**ප්‍රගතිය - 2012** - **ප්‍රධාන ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් සැකිල්ලේ වැඩ (4 වන මහලේ) සිදු කරමින් පවතී. පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රධාන කණු දැමීම සඳහා සූදානම් කර ඇත.**

**ප්‍රතිපාදන 2012 - රු.මි. 160** **මූල්‍ය ප්‍රගතිය 2012 - රු.මි.110.65**

**2012 දක්වා සමුච්චිත වියදම රු.මි.274.406 කි.**

### 5.4.3. වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය

වේයන්ගොඩ ඉදිකර ඇති ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් සම්මන්ත්‍රණ ශාලාවක් හා නේවාසිකාගාරයක් ඉදිකිරීමේ කටයුතු 2011.11.07 දින ආරම්භ කරන ලද අතර එහි වැඩකටයුතු අවසන් කර ඇති අතර එහි වැඩිදියුණු කිරීම් කරමින් පවතී.

**ප්‍රගතිය - 2012**

ජාතික පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි කිරීමේ අපේක්ෂාවෙන් අසල තිබූ වසා ඇති ඇණ කර්මාන්ත ශාලාව පවරා ගෙන නේවාසිකාගාරයක් හා ආපන ශාලාවක් ලෙස පහත පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

- දේශන ශාලාවක් (100 දෙනෙකුට)
- නේවාසිකාගාර පහසුකම්(50 දෙනෙකුට - ගැහැණු)
- රියදුරු කාමරයක්

ඒ අනුව මෙම ගොඩනැගිල්ලේ පහත සංවර්ධන කටයුතු 2012 වසරේදී සිදු කරන ලදී.

- බිම ටයිල් කිරීම - දේශන ශාලාවේ
- බිත්ති සවිමත් කිරීම
- මළ අපවහන පද්ධතිය සකස් කිරීම
- වයරින් කිරීම
- වහලේ කුමේර සකස් කිරීම
- දොර ජනේල සවි කිරීම

**ප්‍රතිපාදන 2012 - රු.මි. 3.00** **මූල්‍යය ප්‍රගතිය 2012 - රු.මි. 1.08**

# 6. විදේශ සංස්කෘතික සබඳතා

## 6.1 කාර්යභාරය

ශ්‍රී ලාංකීය සංස්කෘතිය ලෝක ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම අරමුණු කර ගෙන පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.

- සංස්කෘතික කණ්ඩායම් විදේශයන් සමඟ හුවමාරු කර ගැනීම.
- අධ්‍යයන චාරිකා සඳහා සංස්කෘතික කණ්ඩායම් හුවමාරු කර ගැනීම.
- ස්පර්ශ හා අස්පර්ශ සංස්කෘතික ක්ෂේත්‍රයේ විශේෂඥයින් විදේශයන්ගෙන් ගෙන්වා ගැනීම.
- සංස්කෘතික ප්‍රදර්ශන විදේශ රටවල් වල දී පැවැත්වීම.
- ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රදර්ශනවලට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- විදේශ පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට නිලධාරීන් සහ අදාළ අවස්ථාවලදී ශ්‍රී ලංකා දූත පිරිස් සහභාගී කරවීම.
- සංස්කෘතික වටිනාකමක් ඇති පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය, සංස්කෘතික අගයන් සුරැකීම සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ආයතන (UNESCO, SAARC,ICOMOS, ICCROM, BIMSTEC) වලින් ආධාර ලබා ගැනීමට කටයුතු කිරීම.
- විදේශ ආධාර ලබන ව්‍යාපෘති පිළිබඳ කටයුතු මෙහෙයවීම.
- රටවල් සමග ද්විපාර්ශවික ගිවිසුම් ඇති කර ගැනීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම හා ගිවිසුම් අනුව වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- අන්තර් ජාතික සංස්කෘතික තරඟවලට ශ්‍රී ලාංකිකයන් සහභාගී කරවීම ඇතුළු සම්බන්ධීකරණ කටයුතු.
- විදේශයන්හි ඇති ශ්‍රී ලංකාවේ වටිනා පුරා වස්තූන් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

## 6.2. විදේශ සංචාර - 2012

| | අරමුණ | සංචාරය කරන ලද රට | කාලසීමාව | සහභාගිවුනු සාමාජිකයින් සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | පළමු ආසියා පැසිෆික් කවි උළෙල | වියට්නාමය | පෙබ 01-07 | කවීන් 02 (2011 හොඳම සාහිත්‍ය සම්මානලාභී) | 178,800.00 |
| 02 | ශ්‍රී ලංකා නිදහස් දින සැමරීම | කොරියාව | පෙබ 04 | 02 (රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන්) | 6,600.00 |
| 03 | ජාත්‍යන්තර රංග කලා ආයතනය මගින් පස්වන ලෝක නාට්‍ය දින සැමරීම | පිලිපීනය | මාර් 05-09 | 01 (චිත්‍රපටි/ටෙලි නාට්‍ය ශිල්පීන්) | 102,920.00 |
| 04 | සාර්ක් සාහිත්‍ය උත්සවය | ලක්නව්, ඉන්දියාව | මාර්16-19 | 02 (රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩල ලේඛකයින්) | 167,000.00 |
| 05 | තොරතුරු වාර්තාකරණය හා ඩිජිටල්කරණය පිළිබඳ කලාපීය සමුළුව | බංගලාදේශය | මාර් 28-29 | 09 (අමාත්‍යාංශ නිලධාරීන්) | 471,100.00 |
| 06 | හියු උළෙල | වියට්නාමය | අප්‍රේ 07-14 | 10 (සං.ම. නිලධාරීන්) | 1,069,110.00 |
| 07 | ශ්‍රී ලංකා සංස්කෘතික පෙරහැර | මැලේසියාව | මාර් 25-අප්‍රේ 5 | 01 (අමාත්‍යාංශය) | 95,200.00 |
| 08 | ආසියා පැසිෆික් කලාපීය අමාත්‍යාංශවල සංස්කෘතික විවිධත්ව සංසදය | බංගලාදේශය | මැයි 9-11 | 01 (සංස්.දෙපා.) | 81,888.00 |
| 09 | ඩිජිටල් ලේඛනාරක්ෂණය පිළිබඳ ආසියා නැටුම් සහයෝගිතා සමුළුව | කොරියාව | ජුනි 6-9 | 01 | 26,000.00 |
| 10 | වියට්නාම රජයෙන් සිදු කරන ලද නිල ආරාධනය | වියට්නාමය | ජුනි 6-9 | 05(ගරු අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන්) | 570,000.00 |
| 11 | තායි ශ්‍රී ලංකා සංස්කෘතික උත්සවය | අයෝධ්‍යාපුරය, තායිලන්තය | අගෝ 2-5 | 51 | 1,322,750.00 |
| 12 | ආසියානු නැටුම් සහයෝගිතා සමුළුව | කොරියාව | අගෝ 12-24 | 04 | 185,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | පස්වන බීජින් කලා ද්විපාර්ශ්වික සමුළුව | චීනය | අගෝ 27-සැප් 10 | 01 | 90,700.00 |
| 14 | සංස්කෘතික ව්‍යාපාර සංවර්ධනය (ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවීම) | නව දිල්ලි, ඉන්දියාව | නොවැ 1-6 | 07 (අත්කම් ශිල්පීන් 07) | 237,000.00 |
| 15 | ශ්‍රී ලාංකික සංස්කෘතික උත්සවයකට සහභාගිවීමට | ඉතාලිය | නොවැ 3- 6 | ගරු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා | 1,300,000.00 (ම.ස.අ.) |
| 16 | ගුසි සම්මාන ප්‍රදානෝත්සවය ප්‍රවීන සංගීතවේදී විශාරද දීපිකා ප්‍රියදර්ශනී මෙනවියට හිමි සම්මානය ලබා ගැනීම සඳහා එම සංචාරයට අනුග්‍රහකත්වය ලබාදීම | පිලිපීනය | නොවැ 28 | 06 | 875,415.00 |
| 17 | 15 වන ආසියානු කලා ද්විපාර්ශ්වික චිත්‍ර ප්‍රදර්ශනය | බංගලාදේශය | දෙසැ 01-15 | 06 (කලාකරුවන් 05ක් හා අමා.නිලධාරිව රයෙක්) | 102,129.00<br>317,300.00 (ම.ස.අ.) |
| 18 | ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර දෙවන ද්විපාර්ශ්වීය දේශපාලනික උපදේශකත්වය | තායිලන්තය | දෙසැ 13 -15 | 01 (අමාත්‍යාංශ ලේකම්) | 212,500.00 |

## 6.3 විදේශීය සංචාරක/වෙනත් විශේෂ කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණීම - 2012

| | අරමුණ | පැමිණි රට | සහභාගිවූ නූ සාමාජිකයින් සංඛ්‍යාව | අමාත්‍යාංශයේ කාර්යය භාරය | වියදම් රු. |
|---|---|---|---|---|---|
| 1 | ඉන්දියානු ජනරජ දිනය ශ්‍රී ලංකාවේදී සැමරීම | ඉන්දියාව | 10 (නර්තන ශිල්පීන්) | කොළඹ, නුවර, ගාල්ල, යාපනය යන ස්ථාන වල සංදර්ශන සංවිධානය කිරීම | 534,220.00 |
| 2 | කටාර් රාජ්‍ය නායකයාගේ ශ්‍රී ලංකා සංචාරය | කටාර් | - | පිළිගැනීමේ උත්සවය සංවිධානය | 14,305.00 |
| 3 | ප්‍රංශ වසන්තය ශ්‍රී ලංකාවේදී සැමරීම | ප්‍රංශය | - | ප්‍රංශ ශ්‍රී ලංකා සංස්කෘතික හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම සඳහා දායකත්වය ලබාදීම | 200,000.00 |
| 4 | දකුණු ආසියාවේ මෑතකදී සොයාගත් බෞද්ධ පුරාවිද්‍යාව පිළිබඳ සාර්ක් ජාත්‍යන්තර සමුළුව | සාර්ක් රටවල් | 100 | රාත්‍රී භෝජන සංග්‍රහය සංවිධානය කිරීම | 100,000.00 |
| 5 | ඉන්දියානු සංස්කෘතික අමාත්‍යතුමියගේ ශ්‍රී ලංකා සංචාරය | ඉන්දියාව | 05 | රාත්‍රී භෝජන සංග්‍රහයක් සංවිධානය කිරීම | 90,500.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | සීෂෙල්ස් ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරය | සිෂෙල්ස් | 10 | පිළිගැනීමේ උත්සවය සංවිධානය | - |
| 7 | මාලදිවයින් ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරය | මාලදිවයින | 10 | පිළිගැනීමේ උත්සවය සංවිධානය | - |
| 8 | මාලදිවයින් සංස්කෘතික අමාත්‍යතුමා, සංස්කෘතික හා කලා කටයුතු ගරු අමාත්‍යතුමා හමුවීම | මාලදිවයින | - | සංස්කෘතික කෙෂත්‍රයට අදාළ සාකච්ඡා පැවැත්වීම | - |
| 9 | චීන කොංග්‍රසයේ පක්ෂ නායකතුමාගේ ශ්‍රී ලංකා සංචාරයට අදාළ ව එරට ඉහළ පෙළේ නිලධාරීන්ගේ පූර්ව සංචාරය | චීනය | 20 | එම සංචාරයට අදාළව මූලික කටයුතු සොයා බැලීමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම | - |
| 10 | පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සමුළුව ශ්‍රී ලංකාවේදී පැවැත්වීම | පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් | 200 | නැටුම් සංදර්ශනයක් ඉදිරිපත් කිරීම හා ගුවන්තොටුපලේදී පිළිගැනීමේ උත්සවයක් සංවිධානය කිරීම | - |
| 11 | චීනයේ (NPC) ස්ථාවර කමිටුවේ සභාපති අතිගරු එච්.ඊ. වූ බැන්ගුන් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය | චීනය | 50 | නිදහස් චතුරශ්‍රයේ පිළිගැනීමේ උත්සවය සංවිධානය කිරීම | 11,000.00 |
| 12 | වියට්නාම් ශ්‍රී ලංකා සංස්කෘතික වැඩසටහන | වියට්නාමය | 12 නර්තන ශිල්පීන් | නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී සංගීත හා නැටුම් සංදර්ශනයක් පැවැත්වීම | 100,000.00 |

## 6.4 සංස්කෘතික අවබෝධතා ගිවිසුම් වලට එළඹීම - 2012

| | සංස්කෘතික අවබෝධතා ගිවිසුමට එළඹී රට | දිනය |
|---|---|---|
| 01 | කටාර් රාජ්‍යය | 2012.01.01 |
| 02 | ඉන්දුනීසියානු ජනරජය | 2012.01.26 |
| 03 | ඇෆ්ගනිස්ථානය | 2012.12.19 |

# 7. සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු

අමාත්‍යාංශය විසින් දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 160කට අවශ්‍ය සැපයීම් කටයුතු හා නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු මෙන්ම සාක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම වැනි ප්‍රධාන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ද සිදුකරනු ලබන බැවින් සැපයුම් හා ප්‍රසම්පාදන කාර්යයන් වඩාත් කාර්යක්ෂම අයුරින් සිදු කිරීමට **සැපයුම් හා ප්‍රසම්පාදන අංශයක්** 2011 දී ස්ථාපනය කරන ලදී.

## 7.1. ප්‍රසම්පාදන අංශය මගින් ඉටුකරනු ලබන කාර්ය භාරය

I. ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම්

II. අමාත්‍යාංශයට හා ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවලට අවශ්‍ය උපකරණ හා වෙනත් ගබඩා ද්‍රව්‍ය මිලට ගැනීම.

III. නව වාහන මිලදී ගැනීම, පවත්නා වාහන අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම.

IV. වාහන වලට අවශ්‍ය ටයර් ටියුබ් හා බැටරි මිලට ගැනීම.

V. උත්සව සඳහා අවශ්‍ය වන ආහාරපාන, නවාතැන් ඇතුලු සියලුම සැපයුම් සේවා ලබා ගැනීම.

VI. සංස්කෘතික මධ්‍යස්ථාන වලට අවශ්‍ය නර්තන ඇඳුම් මිලට ගැනීම හා මස්සවා ගැනීම.

VII. ප්‍රකාශන මුද්‍රණය හා මිලට ගැනීම.

## 7.2. කාර්යයභාරය 2012

### 7.2.1. සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

| | ලබාදුන් භාණ්ඩ/සේවාව | සං.මධ්‍යස්ථාන ගණන | මූල්‍යය වටිනාකම රු. |
|---|---|---|---|
| 01. | තිර රෙදි, වතුර මෝටර්, කැමරා, තණ කොළ කපන යන්ත්‍ර, දුරකථන මිල දී ගැනීම, ස්පීකර් අලුත්වැඩියා කිරීම් හා පෙරපාසල් සඳහා සෙල්ලම් මිදුල | 51 | 12,999,210.37 |
| 02. | නර්තන ඇඳුම් | 84 | 6,888,481.25 |
| 03. | සංගීත භාණ්ඩ | 65 | 5,382,508.00 |
| 04. | නර්තන භාණ්ඩ අළුත්වැඩියා කිරීම | 70 | 1,538,113.00 |
| 05. | ඩෙස් පුටු | 102 | 12,616,288.00 |
| 06. | සං. මධ්‍යස්ථාන නාම පුවරු හා සමරු ඵලක | 16 | 703,000.00 |

### 7.2.2. අමාත්‍යාංශය සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

| | ලබාදුන් භාණ්ඩ/සේවාව | මූල්‍යය වටිනාකම රු. |
|---|---|---|
| 01. | ටයර් ටියුබ් මිලදී ගැනීම | 1,689,767.40 |
| 02. | බැටරි මිල දී ගැනීම | 80,448.00 |
| 03. | උත්සව සඳහා ආහාර /නවාතැන් ලබාදීම | 2,608,716.20 |
| 04. | ලිපි ද්‍රව්‍ය | 2,434,520.02 |
| 05. | ටෝනර්/රිබන් | 2,794,732.70 |
| 06. | මුද්‍රණ කටයුතු | 4,012,380.62 |
| 07. | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම | 110,654,093.00 |

# 8.අභ්‍යන්තර විගණන කටයුතු

## 8.1 පිහිටුවීමේ පරමාර්ථ

1. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල අභ්‍යන්තර පාලන ක්‍රමයට සම්බන්ධ වී එම කටයුතු වල වැරදි හා වංචා වැළැක්වීම සඳහා සහ ඒවා අනාවරණය කිරීමට යොදා ඇති අභ්‍යන්තර සෝදිසියේ විධිමත් හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් සිදු කිරීම.

2. එක් එක් ආයතනයන් වෙත පැවරී ඇති සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී/ ප්‍රගති සමාලෝචන කමිටුව වෙත ප්‍රගති පාලනය සම්බන්ධයෙන් සහාය වීම.

3. උචිත අවස්ථාවන් වලදී මෙම කර්තව්‍යන්හී නිරත අයවලුන් සහ ආයතන ප්‍රධානීන් සහ ප්‍රගති / අන්වේෂණ කමිටු අතර සම්බන්ධීකාරකය වශයෙන් ක්‍රියා කිරීම.

## 8.2 කාර්යභාරය

1. වැරදි හා වංචා වැළැක්වීම සඳහා ආයතනය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසිය හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරීත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.

2. ගිණුම් කරණ පිලිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළිවෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.

3. කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාවය ඇගයීම.

4. අලාභහානි වලින් ආයතනය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ඇගයීම.

5. රජයේ ආතයන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන පරිපූරක උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

6. නාස්තිය, නිෂ්කාර්ය දාරිතාවය, පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට යොදා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

7. ආයතනයේ දේපල හා වත්කම් ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව උපයෝජනය කරන්නේ දැයි සොයා බැලීම.

8. අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ශන පැවැත්වීම.

## 8.3 2012 වර්ෂයේදී ඉටුකර ඇති කාර්ය භාරය

**I. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ 2012 ක්‍රියාකාරී සැලැස්ම හා විගණන සැලැස්මට අනුව මාතර නාවිමන ඉදිකරනු ලබන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ හා වැඩිදියුණු කිරීම් සිදුකරන වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානයේ විගණන පරීක්ෂා සිදු කරන ලදී.
- ජාතික නිදහස් දින හා දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයේ අමාත්‍යාංශයේ කටයුතු පරීක්ෂාව හා පහත සඳහන් සංස්කෘතික මධ්‍යස්ථාන 36ක විශේෂ විමර්ශන, මූල්‍යය කළමනාකරණ, විගණන කටයුතු සිදු කරන ලදී.
  - මූල්‍යය හා කළමානාකරණ විගණනය(සංස්කෘතික මධ්‍යස්ථාන - 19)
  - විශේෂ විමර්ශණය (සංස්කෘතික මධ්‍යස්ථාන - 13)

**II. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

රථවාහන පාලනය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම

**III. මධ්‍යම සංස්කෘතික අරමුදල**

ප්‍රවේශපත්‍ර මුද්‍රණය පිළිබඳ පරීක්ෂාව, ප්‍රධාන කාර්යාලයේ මූල්‍යය හා කළමනාකරණ විගණනය හා 2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති 11ක භෞතික හා මූල්‍යය ප්‍රගතිය පරීක්ෂාව සිදු කරන ලදී.

**IV. ටවර් හෝල් රඟහල පදනම**

ඉන්ධන පරිභෝජන පරීක්ෂාව හා මූල්‍ය හා කළමනාකරණ විගණනය

**V. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය**

මූල්‍ය හා කළමනාකරණ විගණනය

# 9. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

## දැක්ම

සාරධර්ම පිරි සමාජයක් ගොඩනැගීම සඳහා සමාජ වගකීමකින් යුක්තව යහපත් කලාවකට ඉඩදෙමින් ප්‍රසිද්ධ රඟ දැක්වීම් උචිත අයුරින් තුළනාත්මකව පාලනය කිරීම.

## මෙහෙවර

චිත්‍රපට නාට්‍ය හෝ සංදර්ශන සඳහා පරීක්ෂා කිරීම කඩිනමින් නිමකර, ඒ සඳහා යෝග්‍යතා සහතික ලබා දීම සහ උක්ත කර්මාන්තයන්හි අභිවෘද්ධිය සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම.

## අරමුණ

යහපත් සදාචාරවත් සමාජයක් ගොඩ නැගීම සඳහා කලාව සහ සමාජ වගකීම යන තේමාවට අනුකූලව, මහජන ප්‍රදර්ශනය සඳහා සංදර්ශන හා කලා නිර්මාණ ඉදිරිපත් කිරීමට අනුබල දීම සහ ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

## ප්‍රධාන කාර්යයන්

වර්තමානය වනවිට ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් සීමිත වපසරියකට යටත්ව ඇත. ඒ අනුව ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය විදේශීය චිත්‍රපට නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත. එහි දී උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කරනු ඇත. ඒ අනුව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය මගින් සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂාකර බලා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ වර්ගීකරණයට ලක් කිරීම සහ සංශෝධනයන් සඳහා නිර්දේශ කිරීම යනාදී කරුණු වත්මන් ප්‍රධාන කාර්යයන් ලෙස දක්වා ඇත.

## 9.1 ප්‍රතිපාදන සහ මූල්‍ය ප්‍රගතිය - 2012

| | 2012 සඳහා වෙන් වූ ප්‍රතිපාදන රු.මි. | 2012 මූල්‍ය ප්‍රගතිය රු.මි. |
|---|---|---|
| පුනරාවර්තන | 3.80 | 3.61 |
| ප්‍රාග්ධන | **2.00** | 0.56 |
| මුළු එකතුව | **5.80** | **4.17** |

## 9.2 කාර්ය මණ්ඩලය - 2012

| | 2012 අනුමත කාර්ය මණ්ඩලය | 2012 පැවති කාර්ය මණ්ඩලය |
|---|---|---|
| මාණ්ඩලික | - 01 | 01 |
| මාණ්ඩලික නොවන | - 04 | 02 |
| කණිෂ්ඨ | - 02 | 02 |

## 9.3. ප්‍රගතිය - 2012

### 9.3.1 2012 ජනවාරි 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ පරීක්ෂාවට ලක් වූ නිර්මාණ

| චිත්‍රපට | 158 |
|---|---|
| සිංහල | 23 |
| දමිළ | 71 |
| හින්දි | 12 |
| ඉංග්‍රීසි | 52 |
| වෙනත් භාෂා චිත්‍රපට | - |
| නාට්‍ය / සංදර්ශන/ D V D / C D | 606 |
| නාට්‍ය | 191 |
| සංදර්ශන | 344 |
| DVD | 71 |
| VCD | - |
| VHS | - |
| මුළු එකතුව | 764 |
| චිත්‍රපටි වර්ගීකරණය | |
| අසීමිත මහජන ප්‍රදර්ශනයට (U) | 99 |
| වැඩිහිටියන්ට වඩාත් සුදුසු (A) | 39 |
| වැඩිහිටයන්ට පමණයි (X) | 14 |
| ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය තහනම් | 01 |
| පූර්ව ප්‍රචාරක චිත්‍රපටි | 43 |

### 9.3.2 2010 - 2012 දක්වා උපයා ඇති රාජ්‍ය ආදායම්

2010,2011 හා 2012 වසර වල රැඟුම් පාලක මණ්ඩලය වෙත යොමු කරන ලද චිත්‍රපට, පූර්ව ප්‍රචාරක පට, වේදිකා නාට්‍ය සහ ප්‍රසංග හා සන්දර්ශන යන වැඩසටහන් සඳහා බලපත්‍ර ලබාදීමෙන් උපයා ඇති රාජ්‍ය ආදායම් පහත පරිදි වේ.

| වසර | ආදායම(රු.මි.) |
|---|---|
| 2010 | 2.25 |
| 2011 | 2.73 |
| 2012 | 3.00 |

### 9.3.3 නිරන්තර සේවා

උක්ත කාර්යයන්ට අමතරව ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය මඟින් මහජනතාවගේ සහ කලා නිර්මාණ කරුවන්ගේ පහසුව පිණිස නිරන්තර සේවාවන් කිහිපයක් ලබා දීමට කටයුතු කරයි. ඒ අනුව,

- සමීක්ෂණ සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට එහි විශේෂ තාක්ෂණික හෝ ප්‍රායෝගික ගැටළුවක් නොමැති නම් සමීක්ෂණය සඳහා භාරදුන් දිනම බලපත්‍ර ලබාදීමට කටයුතු කිරීම.
- සමීක්ෂණය සඳහා ලබාදෙන වේදිකා නාට්‍ය පිටපත් එහි පවතින ප්‍රමුඛතාවය හා අවශ්‍යතාවය අනුව එදිනම සමීක්ෂණය සඳහා යොමු කර හැකි ඉක්මනින් බලපත්‍රය ලබාදීමට කටයුතු කිරීම.
- නාට්‍ය නොවන දර්ශන සඳහා අවම වශයෙන් දිනකින් හෝ දින දෙකකින් බලපත්‍ර ලබාදීමට කටයුතු කිරීම.
- කලාකරුවන් කලා නිර්මාණකරුවන් හා චිත්‍රපට හා නාට්‍යකරුවන් පවතින තත්වයන් පිළිබඳව නිරන්තර දැනුවත් කිරීමටත් මහජනතාව දැනුවත් කිරීමටත් කටයුතු කිරීම.